10

# THE SIGNALLER

## SRI LANKA SIGNAL CORPS JOURNAL - 2008



sch of Sig













THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008

# කතුවැකිය...

ශ්‍රීලංකා සංඥා බලකායට වසර 65 ක් සපිරෙන ඓතිහාසික අවස්ථාවේදී වාර්ෂිකව මුද්‍රණය කරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ 2008 කලාපයේ ප්‍රධාන කර්තෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් සේ සලකමි.

සන්නිවේදන තාක්ෂණයට හා තොරතුරු තාක්ෂණයට මුල් තැනක් දෙමින් දිනෙන් දින දියුණු වන විශ්වය තුල ශ්‍රීලංකා සංඥා බලකායද යුද්ධ හමුදාව තුල නවීන තාක්ෂණයෙන් යුතු සංඥා උපකරණ/තොරතුරු තාක්ෂණික උපකරණ භාවිතා කරමින් දියුණු තාක්ෂණය සමග අත්වැල් බැඳ ගනිමින් තාක්ෂණික නිපුණතාවයකින් යුත් බලකායක් බවට අද වනවිට පත්වී ඇත.

එමෙන්ම "තාක්ෂණයෙන් පිරිපුන් හමුදාවක්" ගොඩනැංවීමෙහිලා සංඥා බලකාය වෙතින් ඉටුකරනු ලබන සේවය තවදුරටත් පුළුල් පරාසයක් කරා ගෙනයාමත්, සංඥා බලකායෙහි කාලීන සිදුවීම් පිළිබඳව අවබෝධයක් ලබාදීමත් හා සියලුම නිළයින්ගේ ලේඛණ හා නිර්මාණ කුසලතාවයන් වැඩිදියුණු කිරීමත් මෙම සඟරාවේ මුඛ්‍ය පරමාර්ථය බැව් අප සැම වටහාගත යුතුය.

එමෙන්ම සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමග, ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්ව ඇති අද වැනි යුගයක "ද සිග්නලර්" සඟරාවද ඉදිරියේදී නව ආරකින් යුතුව වඩාත් සිත්ගන්නාසුළු මුහුණුවරකින් යුක්තව මුද්‍රණය කිරීම සඳහා ඔබ සැමගේ කාලෝචිත, නිර්මාණශීලි අදහස් හා යෝජනා කතෘ මණ්ඩලය වශයෙන් අප ඉත සිතින් අපේක්ෂා කරන්නෙමු.

අවසාන වශයෙන් මෙම් වාර්ෂික කළාපය ඉතා අලංකාර අන්දමින් මුද්‍රණය කොට ඔබ අතට පත්කරන්නට ස්වකීය ශ්‍රමය කැපකල මහනුවර කෙන්ගල්ලහි පිහිටි එන්වන් ප්‍රින්ටර්ස් ආයතනයේ අධිපතිතුමා ඇතුලු කාර්ය මණ්ඩලයටද මාගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරමි.

| පටුන | | පිටු |
|---|---|---|
|  | පෙරවදන | 02-05 |
|  | සංවත්සර | 06-23 |
|  | මතක පොතින් | 24-37 |
|  | උත්තම පූජා | 38 |
|  | කැටපත් පවුර | 39-51 |
|  | මන්දාකිනිය | 52-53 |
|  | මංගල සිනු | 54-55 |
|  | සංවේදී | 56 |

පෙරවදන...



## සංඥා බලකාධිපතිගේ පණිවුඩය

ශ්‍රීලංකා සංඥා බලකාය විසින් පලකරනු ලබන "ද සිග්නලර්" සඟරාවට සංඥා බලකාධිපති වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකන අතර, මෙම වසර තුල සංඥා ඒකක තම සංඥා රාජකාරී තුලින්ද ආධාරක ඒකක පාබල රාජකාරී තුලින්ද දක්වණ කැපකිරීම්, දක්ෂතා අගය කිරීමට අවස්ථාවක් කර ගනිමි.

ලෝකයේ තරගකාරී තාක්‍ෂණික දියුණුව හා සමග වන නව සොයාගැනීම් සෘජුවම ආරක්‍ෂක හමුදාවන්හි භාවිතා කරන තාක්‍ෂණික උපකරණයන්ගේ ගුණාත්මක නවීකරණයන්ට බෙහෙවින් බලපානු ලබයි. ඒසමගින් වූ තාක්‍ෂණික දියුණුව හා ගෝලීයකරණය ත්‍රස්තවාදීන්ගේ සටන් උපක්‍රම දියුණු කිරීමට මහත්සේ බලපා ඇත. පොදුවේ ගත්කල ශ්‍රීලංකා යුද්ධ හමුදාවටත්, විශේෂයෙන්ම නව තාක්‍ෂණික උපකරණ භාවිතයේදී ශ්‍රීලංකා සංඥා බලකායටත් ඉහත අභියෝගයන් වෙත නිරතුරුවම මුහුණ දියයුතු වේ. එසේ බලන කල, පසුගිය වකවානුව තුල ශ්‍රීලංකා යුද්ධ හමුදාවට එක්කරන ලද නව සංඥා උපකරණ ක්‍රියාත්මක කරවීම, නඩත්තු කිරීම හා ත්‍රස්තවාදීන්ගේ නව තාක්‍ෂණ භාවිතයන් සඳහා ප්‍රතිතාක්‍ෂණ නිර්මාණයන් තුලින් සංඥා බලකා සාමාජිකයින් දැක්වූ හැකියාවන් පිළිබඳ පුද්ගලිකවම මා සතුටු වෙමි. තාක්‍ෂණයේ වේගවත් ගමන් මග හා සමවේගී වීමට අඛණ්ඩ තාක්‍ෂණික අධ්‍යාපනය, තාක්‍ෂණික පුහුණුව ඉතා වැදගත් බව මෙහිලා වැඩිදුරටත් සඳහන් කරමි.

අප බලකාය යුද්ධ හමුදාව වෙතින් දියත් කරනු ලැබූ සියළු මානුෂික මෙහෙවරයන් සඳහා රුදුරු ත්‍රස්තවාදීන්ට එරෙහිව විරෝධාර හමුදා ඒකකයන් සමග උරෙන් උර ගැටී නිවැරදි සංඥා සම්බන්ධතා සපයා දෙමින් අපට කටයුතු කරන්නට හැකිවී ඇත්තේ අප බලකාය සතු නිවැරදි පුහුණුව, තාක්‍ෂණික නිපුණත්වය, උපරිම කැපවීම හා එකමුතුකම බැව් මා ගියවර මෙන්ම මෙවරද සිහිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

යුද්ධ හමුදාව තුල අප බලකායට කීර්තියක් අත්පත් කර දෙන්නට දායකවෙමින් අප මාතෘ භූමිය බේරාගැනීම සඳහා ත්‍රස්ටවාදීන්ට එරෙහිව ක්‍රියාන්විත රාජකාරියේ සියළුම නිළධාරී/සෙසුනිළයින් හට මා මේ මොහොතේ ශක්තිය ධෛර්‍යය හා සියළු දෙවියන්ගේ පිහිට ආරක්‍ෂාව පතන අතර, එසේ සටන් වැද මියගිය සියළුම රණවිරුවන් හට මාගේ ගෞරවණීය ආචාරයද පුද කරමින් සටන් බිමේදී තුවාල ලැබූවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

අවසාන වශයෙන් ශ්‍රීලංකා සංඥා බලකායේ සියළුම නිළධාරීන්/සෙසුනිළයින්, සිවිල් සේවක කාර්‍ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට යස ඉසුරු පිරි වාසනාවන්ත අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

ටීඑෆ් මිඩින් ආර්එස්පී එල්ඩීඑම්සී
බ්‍රිගේඩියර්
සංඥා බලකාධිපති, ප්‍රධාන සංඥා නිළධාරී,
ප්‍රධාන තොරතුරු තාක්‍ෂණ නිලධාරී



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008



## සංඥා බලසේනාධිපතිගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් පළකරනු ලබන "ද සිග්නලර්" 2008 වසරේ සඟරාවට සංඥා බලසේනාධිපති වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට අවස්ථාව උදාවීම මා ලද ගෞරවයක් හා භාග්‍යයක් ලෙස සලකමි.

අනුමත ප්‍රධාන සංඥා නිළධාරී සංවිධානය යටතේ වන සංඥා බලසේනා මූලස්ථානය 2008 අගෝස්තු මස 11 දින ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය යටතේ තනි මූලස්ථානයක් වශයෙන් සිය සංඥා රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී. ක්‍රියාන්විත/යුධඋපා මට්ටමේ ප්‍රධාන සංඥා කාර්යයන් සහ අතිරේක උප සංඥා කාර්යයන් සඳහා සංඥා බලසේනා මූලස්ථානය ප්‍රධාන වශයෙන්ම වගකිවයුතු අතර ඒ සඳහා සියළුම සංඥා රෙජිමේන්තු, සංඥා පාසල, විද්‍යුත් සංග්‍රාමික බළඇණිය, මධ්‍යම හා ක්ෂේත්‍ර සංඥා වැඩපළවල් සංඥා බලසේනාවෙහි සෘජු අණදීම් යටතේ ක්‍රියාත්මක වනු ඇත.

දැනට ආසේමු(වන්නි) සහ ආසේමු(යාපනය) බලප්‍රදේශයන්හි පවතින ප්‍රහාරක ක්‍රියාන්විත රාජකාරීන් සඳහා සහ ආසේමු(නැගෙනහිර) ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරී සඳහා මෙන්ම අනෙකුත් ප්‍රදේශයන්හි අභ්‍යන්තරික ආරක්‍ෂ/පාලන කටයුතු සඳහා සංඥා සම්බන්ධතා, විද්‍යුත් සංග්‍රාමික ආධාර, සංඥා බලසේනාව සහ සංඥා රෙජිමේන්තු, විද්‍යුත් සංග්‍රාමික බළඇණියෙහි සම්මිශ්‍රණයෙන් ප්‍රතිඵලදායීව ලබාදිය යුතුවේ. එමෙන්ම සංඥා රෙජිමේන්තු නිළධාරී/සෙසුනිළයින් සහ අනෙකුත් ඒකක නිළධාරී/සෙසු නිළයන් සඳහා සංඥා කටයුතු සම්බන්ධව වූන පුහුණුවීම්, සංඥා පාසල තුළින් ඉදිරියටත් ප්‍රතිඵලදායීව, අඛණ්ඩව ලබාදීම සංඥා බලසේනාවේ අධීක්‍ෂණය යටතේ සිදුවනු ඇත.

තවද, යුධ හමුදාවෙහි පාබල ඒකකයන්හි සීඝ්‍ර වර්ධනය හා ප්‍රහාරක සේනාංක, බලසේනා, බළඇණියන්හි ක්‍රියාන්විත සඳහා වන සංඥා සම්බන්ධතා මෙන්ම යුධ හමුදාවෙහි අනෙකුත් මූලස්ථාන, ආයතනයන්හි පාලන අවශ්‍යතා සඳහා වන සංඥා සම්බන්ධතා සීමිත සම්පත් තුළින් කාර්‍යක්‍ෂමව ලබාදීම අප ඉදිරියේ ඇති අභියෝගයන් වනු ඇත. එහිදී, නම්‍යශීලීත්වය, සංකලනත්වය, ආර්ථික ඵලදායිත්වය වැනි සංඥා මූලධර්ම හා මනා කළමණාකාරීත්වය ඉදිරි අභියෝග ජයගැනීමට මහත්සේ ඉවහල් වනු ඇත.

අවසන් වශයෙන් සංඥා බලසේනා මූලස්ථානය වෙනුවෙන් සංඥා බලකායේ සියළුම නිළධාරීන්ටත්, සෙසු නිළයින්ටත්, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ටත් "ද සිග්නලර්" සඟරාව එළි දැක්වීමට කටයුතු කළ කතෘ මණ්ඩලයටත් මාගේ සුභාශිංෂණය පිරිනමමි.

කේආර්පී රොවෙල් ආර්එස්පී යූඑස්පී පීඑස්සී යූඑස්ඒසීපීඑස්සී
කර්නල්
කාර්ය නියුක්ත සංඥා බලසේනාධිපති



## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් මීට වසර 10 කට ප්‍රථම එළිදැක්වීමට යෙදුන The Signaller වාර්ෂික සඟරාව 2008 වසරේදී එළිදක්වන සිය 10 වන කලාපය වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සලකමි.

සංඥා බලකායේ සාමාජිකයින් ලෙස මෙතෙක් අප ඉටුකළ කාර්‍යභාර්ය තුලින් යුධ හමුදාවට ලබාදුන් සුවිශේෂී දායකත්වයට අමතරව කාලීන අවශ්‍යතාවය වෙනුවෙන් පාබල රාජකාරීන්හි දායකත්වයද ලබාදීමට අප වෙත පැවරී ඇති බැවින්, ඒ වෙනුවෙන් නව ආධාරක බලඇණි 03 ක් හා සංඥා ඒකකයක් නගා සිටුවන ලද අතර එතුලින් අප හට යුධ හමුදාවේ පොදු අරමුණු ඉටුකිරීම සඳහා ශක්තියක් ලබාදීමට ලැබීම අප ලද ජයග්‍රහණයක් බව ඉතා ඕනෑකමින් සිහිපත් කර සිටිමි.

එදා සිට මේ දක්වා අප ආ ගමන් මගේ සියලු තොරතුරු හා සංස්කෘතික මෙන්ම තාක්‍ෂණික තොරතුරු හැකි පමණ කැටි කොට The Signaller වාර්ෂික සඟරාව තුලින් අප වෙත ලබාදුන් දැනුම හා වර්ධනය අතිමහත් වන අතර, මෙතුලින් බිහිවූ නිර්මාණශීලී පිරිස්ද බොහෝය.

අවසන් වශයෙන් මෙවර The Signaller 10 වන කලාපය සාර්ථක කරගැනීම සඳහා නව අදහස් හා නිර්මාණ මෙන්ම නොයෙකුත් තොරතුරු ලබාදීමෙන් දායකත්වය ලබාදුන් සංඥා බලකායේ සියලුම නිළධාරී/සෙසු නිළයින්ටත් ඔවුන්ගේ පවුල්වල අයටත් රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙනුවෙන් විශේෂ ප්‍රණාමය පිරිනමන අතර The Signaller සඟරාව දිනෙන් දිනම දියුණුවට පත් වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ආර්ඒඑස් රණසිංහ යූඑස්පී
කර්නල්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008



සංවත්සර

# 64th Anniversary

## Sri Lanka Signal Corps



64 වන සංවත්සර උත්සව මාලාවේ මියගිය රණවිරුවන් වෙනුවෙන් පැවැත්වූ පුෂ්පෝපහාර උළෙල



සහභාගී වූ රණවිරු දෙමාපියන්ට සංඥා බලකාධිපති විසින් තෑගි පිරිනැමූ අවස්ථාව



64 වන සංවත්සරය නිමිත්තෙන් බලකායේ මියගිය රණවිරුවන් වෙනුවෙන් පැවැත්වූ පිරිත් සජ්ජායනය



මියගිය රණවිරුවන් හට පිං අනුමෝදන් කරමින් පවත්වනු ලැබූ දානමය පිංකමට නිලධාරීන් සහ රණවිරු පවුල් වල සාමාජිකයින් සහභාගි වූ අවස්ථාව





සංවත්සර

# 64th Anniversary

## 1st Regiment Sri Lanka Signal Corps

64 වන සංවත්සරය සමරන ලද පළවන සංඥා රෙජිමේන්තුව සංඥා මෑණියන්ගේ පළවන පුතුනුවන් වේ. ඓතිහාසික පොලොන්නරුව රාජධානියෙහි මින්නේරිය වැව් ඉස්මත්තේ පිහිටා ඇති මෙම ඒකකය ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බළප්‍රදේශයේ සංඥා සම්බන්ධතා මනා ලෙස ඉටු කිරීමෙත්, නිඅභපි (පො) වෙතින් පවරනු ලබන විවිධ ක්‍රියාන්විත රාජකාරීන් ඉටු කිරීමත් තුලින් යුධ හමුදාව තුල කාර්‍යක්‍ෂම සේවයක් ඉටු කරමින් සිටියි.

2007 ඔක්තෝම්බර් මස 14 වන දිනට තම 64 වන සංවත්සරය සැමරූ ප්‍රෞඩ ඉතිහාසයකට හිමිකම් කියන මෙම බළකායේ වෙනමම පුහුණු අංශයක් සාර්ථකව පවත්වාගෙන යනු ලබන අතර, නිළ උසස් කිරීමේ පාඨමාලාවන්ට අමතරව මේ වන විට මූලික සංඥා පාඨමාලා 03 ක් සහ ආධුනික පුහුණු පාඨමාලා 11 ක් සාර්ථකව නිම කොට ඇති බව මෙහිලා සිහිපත් කරනුයේ මහත් සතුටිනි.



නව අණදෙන නිලධාරී විසින් සම්මාන පෙළපාලිය පරීක්‍ෂා කරමින්



21 වන අණදෙන නිළධාරී වශයෙන් ලුතිනන් කර්නල් පීඒජේ පීරිස් අභිනවයෙන් නව තනතුරේ වැඩ භාර ගැනීමේ අවස්ථාව

# 19th Anniversary

## 3rd Regiment Sri Lanka Signal Corps

උතුරු සහ නැගෙණහිර ප්‍රදේශයන්හි සංඥා රාජකාරී ඉටුකිරීම සදහා එවකට අනුරාධපුර රණසේවාපුර ස්ථාපනය කර තිබූ 2 සේනාංක යටතේ එම සේනාංක මූලයට අයත් ගොඩනැගිල්ලක 1989.03.09 දින ආරම්භ කරන ලද 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය එවකට උතුරු ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද සියළුම ක්‍රියාන්විතයන් සදහා සංඥා සම්බන්ධතා සාර්ථක ලෙස සපයන ලදී.

අනුරාධපුර ඉදිකරන ලද 3 ශ්‍රීලංසංබ රෙජිමේන්තු මූලස්ථානය



එමෙන්ම 21 සේමු ගොඩනැගිල්ල වෙතින් ඉවත් වී ස්වාධිනව ස්ථානගතව සිටිම සදහා අනුරාධපුර රජරට සේවයට අයත් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ භූමි භාගයක් ඒකකය වෙත පවරාගැනීමත් පසුජ් තුල ස්ථාන ගතවීම සදහා කටයුතු සිදු කර 2000 මැයි මස 28 දින නව භූමියේ ස්ථානගතවීම ඒකකය ලද මහත් ජයග්‍රහණයක් වේ.

එසේ පෞඩ ඉතිහාසයක් රන් අකුරෙන් සනිටුහන් කරමින් ගොඩනැගුනු 3 වන සංඥා බළකාය 19 වන වසරට පාතබනවාත් සමගම වසර 15 කට ආසන්න කාලයක් යාපනය අර්ධද්වීපය තුල සංඥා රාජකාරින් ඉටු කරන ලද 4 ශ්‍රිලංසංබ ඒකකය හා 3 ශ්‍රිලංසංබ ඒකකය අතර ස්ථාන මාරුවීම් යටතේ 2007.09.18 දින සිට 3 ශ්‍රිලංසංබ ඒකකය යාපනය අර්දධද්වීපයේ සංඥා රාජකාරින් ඉටුකිරීම සදහා ස්ථාන ගතවන ලද අතර යාපනය අර්ධද්වීපයේ ස්ථානගතවී මේ දක්වා වූ කෙටි කාල සීමාව තුල ඒකකය වෙත පවරන ලද රාජකාරින් සියල්ල අණදෙන නිළධාරී වන ලුතිනන් කර්නල් එම්පිජේජස්කේ පටබැදිගේ ගේ මගපෙන්වීම හා උපදෙස් යටතේ ඉතාමත් සාර්ථක ලෙස ඉටුකිරීමේ හැකියාව ලැබී ඇත.



අණදෙන නිළධාරී හට සම්මාන මුරය පිරිනැමීම



3 ශ්‍රිලංසංබ ඒකකය පලාලි ස්ථානගත වීමෙන් අනතුරුව අණදෙන නිළධාරී විසින් සුභ මොහොතින් රාජකාරී ආරම්භකල අවස්ථාව.





# 17th Anniversary

## 4th Regiment Sri Lanka Signal Corps

4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය වර්ෂ 1991 ජුනි මස 05 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය - පනාගොඩ හිදී ඉතා චාම් උත්සවයකින් පසුව පොල්තෙල් පහන දල්වා චාරිත්‍රානුකූලව සංඥා මැණියන් හට තවත් එක් වෘත්තිය සංඥා ඒකකයක් වශයෙන් අප එක්විය.

එදා මෙදා තුර වසර 17 ක කාලසීමාවක් නැගෙනහිර මෙන්ම 11 සේනාංකයේ සංඥා/පාලන රාජකාරී ඉටුකරමින් සිට 1999 ජුනි මස 01 වන දින සිට ආසේමු (යා) බලප්‍රදේශයේ සංඥා /ක්‍රියාන්විත රාජකාරී සඳහා ස්ථානගත වී සංඥා සම්බන්ධතාවයන්හි රණශූරත්වයට පත් මෙම රෙජිමේන්තුව කාලිනව ශ්‍රී ලංකා යුධ හමුදාව මුහුණ දෙන අති බැරෑරුම් අවිනිශ්චිත රණ බිමට එඩිතරව උරදෙනු වස් මුලු මහත් යාපනය අර්දධද්වීපයෙහි ම සංඥා සම්බන්ධතාවය පවත්වා ගැනිමේ භාරදූර කර්තව්‍ය අභිතව භාර ගනිමින් ආරක්ෂක සේනා මුලස්ථානය යාපනය වෙතින් දියත් කරන ලද සියලුම මෙහෙයුම් සඳහා සංඥා සම්බන්ධතාවය ලබාදිම මෙම ඒකකය විසින් සිදුකරන ලදි.

අප ඒකකය මෙසේ දිර්ඝ කාලිනව ක්‍රියාන්විත ප්‍රදේශයක රාජකාරී ඉටුකිරිම තුලින් වෙහෙසට පත්ව සිටි මොහොතක සංඥා බලකාධිපතිතුමාගේ මගපෙන්වීම මත සෙබළුන්ගේ චිත්ත ධෛර්යය නංවාලිම වස් ඒකකය ආසේමු (යා) බලප්‍රදේශයේ මුදවා හැර 2007 ඔක්තෝම්බර් මස සිට ආසේමු (ව) බලප්‍රදේශයේ රාජකාරී සඳහා රණසේවාපුර, අනුරාධපුර කඳවුරෙහි ස්ථානගත කරන ලදි.

වසර ගණනාවක සිට ඒකක සංවත්සර උත්සවයක් ඉතා උසස් අයුරින් පැවැත්වීමට නොහැකි වූ බැවින් ආසේමු (ව) බලප්‍රදේශය වෙත පැමිණ 2008 ජුනි මස 05 වන දිනට යෙදුන 17 වන සංවත්සර උත්සවය මියගිය රණවිරුවන්ගේ ඥාතින් කැටුව ජය ශ්‍රී මහා බෝසමිඳුන් අභියස බෝධිපූජා පිංකම් මාලාවක් පවත්වා අනුරාධපුර ශ්‍රවණ හා දෘෂ්ඨි ආබාධිත මධ්‍යස්ථානයේ දරුවන් සඳහා දිවා ආහාර වේලක් සමගින් ත්‍යාග ප්‍රදානය කර ඒකක අණදෙන නිළධාරී තුමා ඇතුළු සියළුම නිළධාරීන් හා සෙසු නිළයින් පැමිණි ඥාතින් සමග සුහද දිවා භෝජන සංග්‍රහයක් භුක්ති විඳින ලදි. ඉන්පසුව 2008 ජුනි මස 05 වන දින අණදෙන නිළධාරීතුමා වෙත සම්මාන මුරයක් සමගින් ඉතා උසස් සම්මාන පෙළපාලියක් පවත්වා එදින දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදි. පසුව ඒකකයේ සහ ඒකකයට අනුයුක්තව රාජකාරී කරනු ලබන සෙබළ/සෙබළියන් කැටුව සුහද හමුවක් පවත්වන්නට යෙදුණි.



අණදෙන නිළධාරී හට සම්මාන මුරය පිරිනැමීම



සම්මාන පෙළපාලිය අණදෙන නිළධාරීගේ පරීක්ෂාවට ලක් කිරීම

# 14th Anniversary

## 5th Regiment (RFT) Sri Lanka Signal Corps

### 5 ශ්‍රීලංසංබ ඒකකයේ ඉතිහාසය

**ඒකක අණදෙන නිළධාරීවරුන්**

| | | |
|---|---|---|
| මේජර් | ඊපීද ඉසෙඩ් අබේසේකර | 1994.01.02 - 1994.07.01 |
| ලුතිනන් කර්නල් | ඊපීද ඉසෙඩ් අබේසේකර | 1994.07.02 - 1995.06.08 |
| ලුතිනන් කර්නල් | එච්එම්එච්ජ් හේරත් | 1995.06.09 - 1996.06.27 |
| ලුතිනන් කර්නල් | කේඑම් නවරත්න | 1996.06.28 - 1998.01.04 |
| මේජර් | ඊආර් සමරසිංහ | 1998.01.05 - 1999.11.12 |
| මේජර් | ආර්ඒඑස් රණසිංහ | 1999.11.13 - 2000.07.01 |
| ලුතිනන් කර්නල් | ආර්ඒඑස් රණසිංහ | 2000.07.02 - 2001.01.11 |
| මේජර් | ඩී ඒකනායක | 2001.01.12 - 2002.12.30 |
| මේජර් | එම්ටී වෛද්‍යරත්න | 2002.12.31 - 2005.01.27 |
| මේජර් | එච්පී සෙනවිරත්න | 2005.01.28 - 2005.05.12 |
| ලුතිනන් කර්නල් | එච්පී සෙනවිරත්න | 2005.05.13 - 2005.10.24 |
| ලුතිනන් කර්නල් | එන්එම් හෙට්ටිආරච්චි | 2005.10.25 - 2006.08.25 |
| මේජර් | පීජේ පීරිස් | 2006.08.26 - 2007.07.15 |
| මේජර් | ඩබ්එල් ප්‍රේමසිරි | 2007.07.16 - 2007.10.10 |
| ලුතිනන් කර්නල් | ඩබ්එල් ප්‍රේමසිරි | 2007.10.11 - 2008.02.19 |
| ලුතිනන් කර්නල් | පීජේ පීරිස් | 2008.02.19 - 2008.08.11 |
| මේජර් | බීඩබ්එම්ජේඒ ප්‍රේමදාස ආර්එස්පී | 2008.08.12 - මේ දක්වා |



නව අණදෙන නිළධාරී වැඩ භාරගැනීම



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008







5 ශ්‍රීලංසංබ නව අණදෙන නිළධාරී වශයෙන් මේජර් බීඩබ්එම්ජේඒ ප්‍රේමදාස ආර්එස්පී විසින් 2008.08.15 දින වැඩ භාරගැනීමේ අවස්ථා

# 11th Anniversary

## 6th Regiment (RFT) Sri Lanka Signal Corps

1997 ජනවාරි 10 දින ශ්‍රීලංකා සංඥා බළකායට එක්වූ 6 වැනි සංඥා බළකාය මේ වන විට සිය දොලොස් වෙනි වසරට පා තබමින් සිටියි.

1997 වර්ෂයේ වැලිඔය ප්‍රදේශයේ ස්ථානගතව ක්‍රියාන්විත රාජකාරීන් ආරම්භ කරන ලද මෙම බළකාය වව්නියාව, මන්නාරම, පාප්පමොටෙයි, උයිලන්කුලම්, පිරමනාලන්කුලම්, වාවකච්චේරි, කොඩ්කාමම්, පේදුරුතුඩුව හා කිලාලි යන ප්‍රදේශයන්හි ස්ථානගතව රාජකාරීන් ඉටුකර මේ වනවිට මුහමාලෙයි ඉදිරි ආරක්‍ෂක වළල්ලෙහි රාජකාරීන්හි නිරත වෙමින් ස්වකිය රාජකාරීන් මනාව ඉටුකරමින් සිටියි.

ඒකකයේ ඇති ක්‍රියාන්විත රාජකාරීන් සහ නොයෙකුත් අපහසුතා මධ්‍යයේ ඒකකයතුලම වෘත්තිය පරීක්‍ෂණ හා නිළ උසස් කිරීමේ පාඨමාලා පවත්වමින් ඒකකයට අවශ්‍ය නිළ සංස්ථාව ස්ථාපිත කරගැනිමටත්, ආධාරක බළඇණියක සෙබළුන් වශයෙන් සතුවිය යුතු යුධ දැනුම, යුධ හැකියාවන් වර්ධනය කරගැනීමටත් ඒකකයේ සියළුම අයවළුන් මහත්වූ කැපවීමකින් යුතුව කටයුතු කරයි. මෙම අභිප්‍රාය මුදුන්පත් කර ගැනිම සඳහා එක් එක් වෘත්තින්ට දක්‍ෂතාවයන් ඇති ජ්‍යෙෂ්ඨකොනොහින්, කොනොහින් අවශ්‍ය පාඨමාලා වෙත යොමුකරවමින් වසර 12 ක ඉතිහාසයකට උරුමකම් ඇති මෙම ඒකකය ස්වකිය ඒකකයටම අයත් සෙනින්ගෙන් සමන්විත ඒකකයක් වශයෙන් නැගී සිටීමට උත්සහ දරමින් සිටියි.

ඒකකය පසුගිය වසරක පමණ කාලය තුල යාපනය අර්ධද්වීපයේ වැදගත් ප්‍රදේශ තුනක ස්ථානගතව රාජකාරීන් ඉටුකර ඇත. 2004.02.13 දින සිට පේදුරුතුඩුව ප්‍රදේශයේ ස්ථානගතව පැවැති ඒකකය 2007.08.13 දින කිලාලි ප්‍රදේශයේ ස්ථාපිතව ස්වකිය මෙහෙවර ඉටුකර ඇත. මෙම ඒකකය යාපනය බලප්‍රදේශයේ සිදුකර ඇති ක්‍රියාන්විත මෙහෙවර තුලින් ගොඩනගාගත් විශ්වාසනියත්වය සහ ප්‍රතිරූපය හේතුකොට ගෙන මුහමාලේ ඉදිරි ආරක්‍ෂක වළල්ලෙහි ක්‍රියාන්විත රාජකාරීන් සඳහා 2007.12.17 දින සිට ස්ථානගත කර ඇති අතර, මෙම අභියෝගාත්මක සහ භාරදූර වගකීම දැනට මාස 7 කට අධික කාලයක් සාර්ථකව ඉටුකරනු ලබයි.

මෑත ඉතිහාසයේ 6 වන සංඥා බළකායේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස 2008.04.23 දින ත්‍රස්තවාදින්ගේ මුහමාලේ ඉදිරි ආරක්‍ෂක වළල්ල මුදා ගැනීමට යුද්ධ හමුදාව දියත්කල ක්‍රියාන්විතය සඳහන් කල හැක. 53 සහ 55 සේනාංකයන් යටතේ ස්ථාපිත පාබල ඒකක වෙතින් මෙම ක්‍රියාන්විතය සිදුකරන ලදි. එහිදී මෙම ඒකකයේ විශේෂ පාබල ඛණ්ඩය 6 ශ්‍රීලංසිරේ හඩ පිරිස් සමග ක්‍රියාන්විතයනට සහභාගි වු අතර, ඒකකය වෙත අනුයුක්ත ඒ, බී, සී, හා ඩී කණ්ඩායම් හතරෙහි හඩපිරිස් ක්‍රියාන්විතයට ඉඳුරාම සහභාගි වු පාබල ඒකක හඩපිරිස් සමග උරෙන් උර ගැටී සටනේදි තුවාල ලැබූ සෙනින් ඉවත් කිරිම, ඉදිරි සෙබල හඩපිරිස් වෙත පතුරොම්/වෙඩිදූව්‍ය සැපයිම වැනි කාර්‍යන්වලට ඉතා එඩිතර ලෙස සහභාගි වි උපරිම සහයෝගයක් ලබාදෙන ලදි. මෙම ක්‍රියාන්විතයේදි මෙම ඒකකයට අයත් සෙනින් 03 දෙනෙකු තුවාල ලබන ලදි. ක්‍රියාන්විතයේදි දැක්වූ එඩිතර, කාර්‍යශූර ක්‍රියාකලාපය පසුව පාබල ඒකකයන්හි අණදෙන නිළධාරීන්ගේද, බළසේනාධිපතිවරුන්ගේද, සේනාංකාධිපතිතුමා සහ ආසේමු(යා) ආඥාපතිතුමාගේද පැසසුමට ලක්විය.

6 වන සංඥා බළකායේ 11 වන සංවත්සරය 2007 වසරේ ජනවාරි 10 දිනට යෙදි තිබුණු අතර එහි වැදගත්ම අංගයන් ලෙස පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදි.



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008

වසර 11 ක ඉතිහාසය තුල ක්‍රියාන්විත රාජකාරීන්වලදි මව්බිමේ සුරක්‍ෂිතභාවය වෙනුවෙන් 6 ශ්‍රීලංසංබ ඒකකයට අයත් විරෝධාර රණවිරුවන් 48 දෙනෙකු තම උත්තරීතර ජිවිතය පූජාකර ඇති අතර, නිළධාරී /සෙසුනිලයින් 07 x 64 දෙනෙකු තුවාල ලබා ඇත.

වසර 11 ක් වැනි කාලයක් තුල ඒකකය ලබා ඇති ප්‍රගතිය සහ ඒකකයේ සාමාජිකයින් ලබා ඇති වෘත්තිය නිපුණත්වය සහ ක්‍රියාන්විත රාජකාරීන් තුලින් ලබා ඇති පරිනතභාවය පිළිබඳ සත්‍ය වශයෙන්ම සතුටුවිය හැක. ඒකකය තුල පසුගිය වසර 11 ක කාලය තුල සේවය කල සියළුම නිළධාරීන් හා සෙසුනිලයින්ගේ කැපවීම, උනන්දුව සහ දායකත්වය 6 වන සංඥා බළකාය වර්‍තමානයේ ලබා ඇති ප්‍රගතියට ඉවහල්වී ඇති බවද අවිවාදයෙන්ම පිළිගත යුතු සත්‍යයකි.






6 ශ්‍රීලංසංබ 11 වන සංවත්සරය නිමිත්තෙන් ශ්‍රී දළදා සම්දුන් අභියස බුද්ධ පූජාවක් පවත්වා ආගමික වතාවත් ඉටුකර ස්වාමීන් වහන්සේලා 24 නමක් උදෙසා දහවල් දානය පිළිගැන්වීම.

# Inauguration Ceremony

## 7th Regiment (RFT) Sri Lanka Signal Corps

යුධ හමුදාවේ ව්‍යාප්තියත් සමග දශක තුනක පමණ කාලයක් මුළුල්ලේ මාතෘ භූමියේ සෙවරී භාවය උදෙසා කුරිරු ත්‍රස්ථවාදීන් හමුවේ සටන් වැදී සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව යුධ හමුදාපති තුමාගේ අණදීම යටතේ ඉතාමත් සාර්ථකව ජයග්‍රහණ ලබාගනිමින් පියවරෙන් පියවර ඉදිරියට යන පාබල ඒකක හා සමඟ සංඥා බලකා ඉතිහාසයේ ප්‍රථම වරට සෘජුවම සංග්‍රාමික භූමියට පිවිසීම පිණිස, සංඥා මැණියන්ට දාව 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකා (ආධාරක බලඇණිය) කුමරු 2008/02/08 වන දින 18 × 525 භට පිරිසකින් යුතුව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමියේදී අභිනවයෙන් ආරම්භ කරන ලදි. ආරම්භක මොහොත සනිටුහන් කරමින් ඒකකයේ ප්‍රථම අණදෙන නිළධාරී වශයෙන් වැඩ භාරගත් මේජර් ඩීබීසී ජයසිංහ පීඑස්සී භට එදින සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලදි. සංඥා බලකාධිපති බ්‍රිගේඩියර් ටීඑෆ් මිඩින් ආර්එස්පී එල්ඩීඑම්සී විසින් ඒකක ධජය ගුවනේ ලෙලදීමෙන් පසු ඒකකයේ රාජකාරී කටයුතු සඳහා මූලාරම්භය යොදන ලදි.

ඉන් අනතුරුව බලඇණි පුහුණුවීම් කටයුතු සඳහා සංග්‍රාමික පුහුණු පාසල කොක්එළිය වෙත පැමිණි මෙම ඒකක හඩපිරිස් 2008.02.08 දින සිට 2008.03.08 දින දක්වා වන කාල සීමාව තුල ඉතා සාර්ථකව පුහුණු පාඩමාලාව නිම කරන ලදි. 2008.03.16 වන දින සිට 57 සේනාංක මූලස්ථානය යටතේ රාජකාරී කිරීම පිණිස 573 බසේමු වෙත අනුයුක්තව නොච්චිකුලම් ඉදිරි ආරක්ෂක වළල්ලෙහි ක්‍රියාන්විත රාජකාරී ඉටු කරමින් සිටියදී නව සේනාංකයක් වශයෙන් ස්ථාපනය කරන ලද 2 කාර්ය සේනාංකයට අයත් 621 බළසේනා මූලස්ථානය යටතේ වව්නියාව නොච්චිකුලම් ඉදිරි ආරක්ෂක වලල්ල රැඳුරු ත්‍රස්ථවාදීන්ගෙන් මුදවාගෙන දිනෙන්දින පැමිණෙන සියළුම බාධක මැඩගනිමින් ශක්තිමත් ඒකකයක් ලෙස ඉදිරියට යන්නෙමු.

එදින පටන් නොච්චිකුලම් ඉදිරි ආරක්ෂක වළල්ලේ ක්‍රියාන්විත රාජකාරී ඉටු කරමින් අද දින තෙක් අප ආ ගමන් මඟට සවියක් වූයේ සංග්‍රාමික පුහුණුවීම් තුලින් ලබාගත් මනා පෞරුෂත්වයත්, සටන්කාමීත්වයත් සහ සාමූහිකත්වයත් බවට කිසිම සැකයක් නැත.



අභිනවයෙන් ආරම්භ කරණ ලද 7 වන රෙජිමේන්තුව
ශ්‍රී ලංකා සංඥා බලකාය(ආධාරක බලඇණිය) ප්‍රථම අණදෙන නිලධාරී වශයෙන්
මේජර් ඩීසී ජයසිංහ පීඑස්සී අණදෙන නිලධාරී රාජකාරී භාර ගැනීම





# Inauguration Ceremony

## 8th Regiment (RFT) Sri Lanka Signal Corps



නව අණදෙන නිළධාරීහට සම්මාන මුරය පිරිනැමීම.



නව අණදෙන නිළධාරී උත්තමාචාර පෙළපාලිය පරීක්ෂාකිරීම.



නව අණදෙන .නිළධාරී විසින්
පොල්තෙල් පහන දැල්වීම



නව අණදෙන නිළධාරී වැඩ භාරගැනීම



නව අණදෙන නිළධාරී විසින්
සියළු නිලයින් ඇමතූ අවස්ථාව

# 7th Anniversary

## Signal Base Workshop

යුධ හමුදාව තුළ වු ඉලෙක්ට්‍රොනික් සහ ගුවන් විදුලි/දුරකථන උපකරණ අලුත් වැඩියා කටයුතු සැපිරීම සඳහා 1964 වසරේ සංඥා මූලික වැඩපළ ඛණ්ඩයක් වශයෙන් ස්ථාපිත කරන ලද අතර එතැන් පටන් 1 වන සංඥා රෙජිමේන්තුව යටතේ M ඛණ්ඩය වශයෙන් දිගු කලක් රාජකාරි කරමින් , 1991 අගෝස්තු 01 වන දින සිට සංඥා මූලික වැඩපළ බළඝණයක් වශයෙන් ව්‍යාප්ත විය. කාලීන යුධ අවශ්‍යතා මත 2000 අගෝස්තු 13 වන දින සිට නිළධාරී 24 ක් සහ සෙසු නිළයින් 513 ක් සමන්විත ව්‍යුහයකින් යුක්තව සංඥා මූලික වැඩපළ ස්වාධීන ඒකකයක් ලෙස සංඥා බළකායට එක්විය.



මෙම ඒකකය ආරම්භයේ සිට නිළධාරී අණදෙන/සේනාවිධායක වරුන් ලෙස 10 දෙනෙකු අණ දීම් සිදු කර ඇති අතර වත්මනෙහි 11 වන සේනාවිධායක වශයෙන් 2007/09/06 දින සිට මේජර් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පි කටයුතු කරනු ලබයි.

ගත වූ කාලය තුළ සිදුවූ විශේෂ සිදුවීම් අතර පකිස්ථානයේ NRTC ආයතනයේ මූල්‍යමය දායකත්වය මත සංඥා මූලික වැඩපළෙ හි PRC 9600 ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ අංශයක් ස්ථාපනය කරන ලද අතර එය 2008/01/17 වන දින සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් වයිඑස්ඒ ද සිල්වා යුඑස්පි පිඑස්සි විසින් විවෘත කරන ලදි.

පකිස්ථානයේ NRTC ආයතනයේ නිළධාරීන් විසින් සංඥා මූලික වැඩපළ හි නිළධාරීන් සහ සෙසු නිළයින් සඳහා PRC 9600 ගුවන් විදුලි යන්ත්‍රය සබැඳිව විශේෂ වූ පුහුණු සැසි වාරයක් 2007-12-27 දින සිට 2008-01-10 දින දක්වා පවත්වන ලදි

සංඥා මූලික වැඩපළ ඒකකයේ 8 වන සංවත්සරය 2008 අගෝස්තු මස 13 වන දින ආගමික වතාවත් වලට සහ සමාජ සුභසාධන කටයුතු වලට මුල් තැන දෙමින් අභිමානවත් අයුරින් සමරන ලදි.



නිළධාරී සහ සෙසුනිළ සුහද හමුව.



අවිස්සාවේල්ල බුද්ධිමය ආබාධිතයන්ගේ නිවාසයේ නේවාසිකයන් හට දිවා ආහාරය සහ ඔවුන් වෙත තෑගි ප්‍රධානය කිරීම



සේනාවිධායක වෙනුවෙන් පවත්වන ලද සම්මාන මුරය සහ සම්මාන පෙළපාලිය.





# 18th Anniversary

## Information Technology Unit

1980 දශකයේ මුල් භාගයේදී පමණ SINCLAIR නමින් පරිඝණක යන්ත්‍රයක් ශ්‍රී ලංකා යුධ හමුදාව මුල් වරට භාවිතයට ගත් අතර තවත් පියවරක් පෙරට තබමින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ පරිඝණක ගත කිරීමේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම අරමුණු කොට 1985 වසරේදී යුධ හමුදා පරිඝණක කමිටුව නමින් කමිටුවක් පිහිටුවන ලදි. එහි ප්‍රථම සභාපති වශයෙන් බ්‍රිගේඩියර් පීජීවී ඇලපාත පත් කරන ලද අතර මෙය යුහමු පැරණි ගොඩනැගිල්ලේ ස්ථාන ගත විය.

1986 ජනවාරි මස පමණ වන විට යුධ හමුදාවේ කාර්යභාරයන් පරිඝණක ගත කළ හැකි ආකාරය පිළිබඳව මූලික අධ්‍යයනය සහ අදාල උපදේශාත්මක සේවා ලබාදීම සඳහා ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව වෙත භාරදෙන ලදි. අනතුරුව යුද හමුදාව තුළ පරිඝණක ක්ෂේත්‍රය දිගු කලක සිට යල් පැන ගිය යන්ත්‍රෝපකරණ හා පිලිවෙත්වලට සීමාවී තිබූ බවත්, මෙය අදහා ගත නොහැකි ලෙස ජාතියේ අත්‍යාවශ්‍ය ආරක්ෂක අත්වැල් වෙතින් නවීන තාක්ෂණය උදුරා ගැනීමක් ලෙස මර්චන්ට් බැංකුව විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යයන වාර්තාවට අනුව පෙන්වා දී තිබුණි. මේ අතරතුරේදී යුද හමුදා කටයුතු ක්‍රමයෙන් වෙනස් වෙමින් හට පිරිස් තරමක් ශක්තිමත් වන්නට වූ අතර අවශ්‍යතාවය මත නව පරිගණක උපකරණ හා බඩු බාහිරාදිය මිලට ගන්නා ලදි.

ස්වයං දත්ත සැකසුම් සේවාව යුහමු ගොඩනැගිල්ලේ 1988 ජුනි මස 01 දින සිට මාණ්ඩලික නිළධාරියෙකු යටතේ ස්ථාපිත විය. එහි ප්‍රථම මාණ්ඩලික නිළධාරී ලුතිතන් කර්නල් ඒඑස් වරකාගොඩ - ශ්‍රීලංසංබ විය. 1980 දශකයේ අගභාගය වන විට පරිඝණක යන්ත්‍ර 18 ක් පමණ යුධ හමුදාවේ ප්‍රධාන අම/මූලස්ථාන සමහරෙක ස්ථාපනය කොට තිබිණි. මෙම යන්ත්‍ර ක්‍රියාකරවීම එම ආයතනයන්හි ශ්‍රීලයුකාඛ සහ විවිධ ඒකකයන්ට අයත් සෙනින් විසින් සිදු කරන ලදි.

1990 දශකයේ ආරම්භය වන විට පරිඝණක යන්ත්‍ර 50 ක් පමණ යුද හමුදාවට අයත්ව තිබූ අතර වෘත්තික නිළධාරීන් 20 ක් සහ සෙසු නිළයින් 25 ක් පමණ පරිඝණක ක්‍රියාවලියේ නියැලෙන්නට විය. 1991 අගෝස්තු මස 23 වන දින සංඥා බලකාය යටතේ විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය නමින් මෙම ඒකකය නගා සිටුවන ලදි. මෙය යුද හමුදාවේ පරිඝණක ක්ෂේත්‍රයේ ව්‍යාප්තියට අඩිතාලමක් විය. සංඥා බලකාය, පොදුසේවා බළකාය, කාන්තා බළකාය හා ආබාධිත තත්වයට පත් නිළධාරීන් 44 ක් සහ සෙසුනිළයින් 382 ක් අද වන විට මෙම ඒකකය සතුව සමස්ථ යුද හමුදාවේ පරිඝණක ක්ෂේත්‍රයේ නියැලි සිටී.

1990 වසරේ අග භාගය වන විට පරිඝණක ජාලගත කිරීම සහ අන්තර් ජාලය කරලියට පැමිණීමත් සමග තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ඉතා සීඝ්‍ර දියුණුවක් ලැබූ අතර, මෙම බලපෑම මත යුද හමුදාවේ ප්‍රධාන ආයතන ගණනාවක් අන්තර්ජාල පහසුකම් සහිතව ජාලගත කරන ලදි. තවද, එල්ටීටීඊ ත්‍රස්ත්‍රවාදීන් අන්තර්ජාලය උපයෝගී කොටගෙන ලොව පුරා ශ්‍රී ලංකා රජයත්, ජනතාවත්, විශේෂයෙන් ත්‍රිවිධ හමුදාවත්, අපකීර්තියට පත්වන ආකාරයට අසත්‍ය ප්‍රචාර පතුරවමින් සිටි අතර මේ සඳහා ප්‍රතික්‍රියා දැක්වීමටත් සත්‍ය තොරතුරු ලොවට හෙළි කිරීම උදෙසා ශ්‍රී ලංකා යුධ හමුදාවේ වෙබ් අඩවිය www.army.lk නමින් දියත් කරන ලදි.

මේ වන විට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය මෙන්ම එහිදී භාවිතා කරන වචනද දිනෙන් දින යාවත්කාලීන වූ අතර "විද්‍යුත් දත්ත" යන වචන මෙම භාගය වන විට භාවිතයෙන් ඉවත්ව තොරතුරු තාක්ෂණ නමින් ඉදිරියට පැමිණියේය. මේ අනුව මෙතෙක් භාවිතා කල විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය යන නාමය තොරතුරු තාක්ෂණ ඒකකය යනුවෙන් 2003 ඔක්තෝම්බර් මස 14 වන දින වෙනස් කරන ලදි. මෙම ඒකකය 2005 නොවැම්බර් මස 30 දින මෙතෙක් සංඥා රෙජිමේන්තුව යටතේ පැවතීම වෙනුවට යුද හමුදාව තුළ නව ඒකකයක් ලෙස ස්ථාපනය වූ අතර ඉන්පසු පාලනය සභාපති පරිගණක කමිටුවෙන් ඉවත් කර අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික යටතට පත් කරන ලදි.

යුද හමුදාවේ ස්වාධීන සේවා ඒකකයක් වශයෙන් නවීන තාක්ෂණයෙන් පරිපූර්ණ වූ පසුබිමක් යටතේ හෙට දිනයේ සැබෑම ලෙසින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලියේ පරිපූර්ණ ජීවනාලිය වීමට මෙම ඒකකයට තව බොහෝ දුරක් යාමට තිබේ. එයට ඇති බාධක සහ කඳුහෙල් දුර්ගයන් බොහෝ පවතී. එම අභියෝගයන් හමුවේ නොසැලී සිටීමට අවශ්‍ය ධෛර්යය හා ශක්තිය මෙම ඒකකය සතුව ඇත. එසේම තොරතුරු තාක්ෂණය මේ වන විට යුධ හමුදාවේ සෑම ක්ෂේත්‍රයක් පුරාම ව්‍යාප්ත වෙමින් පවතී. එම නිසා මෙම ඒකකය නගා සිටුවීමට යුධ හමුදාවේ සියලුම අයවලුන්ගේ ආශිර්වාදය සහ සැබෑ මග පෙන්වීමක් නිබඳවම ඇවැසි වන අතර එම ශක්තිය ධෛර්යය සහ අධිෂ්ඨානයෙන් යුතුව යුධ හමුදාව තුල තොරතුරු තාක්ෂණය සමගින් දිගු ගමනක් සඳහා රැගෙන යාමට මෙම ඒකකයේ නිලධාරීන් හා සෙසුනිලයින් සැදී පැහැදී සිටී.



මේජර් ඩීඑල්ඩබ්ලියු ද සිල්වා
ශ්‍රීලංසංබ සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් අයුරු





# 17th Anniversary

## School of Signals

18 වන වියට එළඹි සංඥා පාසැල "පුහුණුවෙන් වෘත්තිය නිපුත්වය" සංකල්පයට මුල්තැන දෙමින් සමස්ථ යුද්ධ හමුදාවේම පුහුණු පාසැල් අතර සංඥා බලකායට මහත් කීර්තියක් ගෙනදෙමින් ඉතා උසස් තත්වයෙන් යුත් පුහුණු පාසැලක් බවට පත්වී ඇත. සංඥා බලකායේ සහ පාබල ඒකකයන්හි සංඥා වෘත්තීන්ට අදාල වූ පුහුණු පාඨමාලා මෙන්ම, ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින් හට ද සංඥා වෘත්තිමය දැනුම ලබා දීමේ අරමුණින් යුක්තව පහත සඳහන් පාඨමාලාවන් සංඥා පුහුණු පාසල වෙතින් පවත්වාගෙන යනු ලබයි.

- මූලික සංඥා පුහුණු පාඨමාලා
- වෘත්තිය පරීක්ෂණ 1 වන ශ්‍රේණිය පාඨමාලා
- කෝප්‍රල් සිට සැරයන් දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලා
- රෙජිමේන්තු සංඥා නිළධාරී පාඨමාලාව (වෙනත් ඒකක)
- ජේකොනොනි සංඥා උපදේශ පාඨමාලා (වෙනත් ඒකක)
- වෙනත් ඒකක සංඥා පුහුණු පාඨමාලා
- විද්‍යුත් සංග්‍රාමික පාඨමාලා (ත්‍රිවිධ හමුදාව සඳහා)
- මූලික පරිගණක පාඨමාලාව
- ආධුනික පුහුණු පාඨමාලාව

යුද්ධ හමුදාපතිගේ සංකල්පයට අනුව "වෘත්තිමය හා තාක්ෂණයෙන් පිරිපුන්" හමුදාවක් ඇති කිරීමේ පරම අභිමතාර්ථය තවදුරටත් තීව්‍ර කරමින් මෙම පාසල වෙතින් තොරතුරු තාක්ෂණය ප්‍රගුණ කිරීමේ අරමුණින් නව පරිගණක විද්‍යාගාරයක් ද ආරම්භ කරන ලදි. සංඥා බළකා ලිපිකරුවන්ගේ වෘත්තිය දැනුම ඔප්වත් කිරීමේ අරමුණින් මූලික පරිගණක පාඨමාලා දෙකක් ද මේ වන විට සිදුකර ඇත.

එමෙන්ම සංඥා බළකා ජ්‍යෙකොනොනින්ගේ වෘත්තිමය රාජකාරීන් තවත් ඉහළ නැංවීමේ අරමුණින් හා පරිපූර්ණ ජ්‍යෙකොනොනියෙක් බිහිකිරීමේ පරමාර්ථයෙන් "ජ්‍යෙකොනොනි සංස්කරණ" පාඨමාලාවක්ද ඉදිරියේදී පැවැත්වීමට කටයුතු සිදුකර ඇති බැව් මෙහිලා සිහිපත් කරනුයේ මහත් ආඩම්බරයෙනි.

මෙම වසර තුල නව ඉදිකිරීම් ලෙස මුරහල හා ජන අවන්හල නගා සිටුවන ලද අතර, ප්‍රධාන දේශණ ශාලාව, ගුවන් විදුලි විද්‍යාගාරය හා දුරකථන විද්‍යාගාරය සිසුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම උදෙසා යොදාගතහැකි අයුරින් නවීන තාක්ෂණයට අනුව නවීකරණයට භාජනය කර ඇත.



17 වන සංවත්සරය වෙනුවෙන් පවත්වනු ලැබූ සම්මාන පෙළපාළිය




17 වන සංවත්සරය වෙනුවෙන් අරුප්පල වැඩිහිටි නිවාසය වෙත පවත්වනු ලැබූ දානමය පුණ්‍ය කර්මය

# 11th Anniversary

## 2nd Regiment Sri Lanka Signal Corps (Volunteer)

2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්), ශ්‍රී ලංකා සංඥා බළසේනාව යටතේ 1 වන බළඝණය ශ්‍රී ලංකා සංඥා බළකාය ලෙස 1980 අගෝස්තු මස 07 දින හවනි 21/80 නගාසිටුවීමේ උපදෙස් මගින් නිළධාරීන් 8 දෙනෙකු හා සෙසුනිළයින් 200 දෙනෙකුගෙන් යුතුව, බළඝණාධිපති වරයෙකුගේ අණදීම යටතේ බළඝණයක් වශයෙන් උපත ලැබිය.

මෙම බළඝණය 1 ශ්‍රිලංසංඛ අණදෙන නිළධාරිගේ පාලනය යටතේ ක්‍රියාත්මක වු අතර, 1989 ජනවාරි මස 26 දින හවනි 05/89 නගාසිටුවීමේ උපදෙස් මත 1980 අප්‍රේල් මස 25 දින සිට බලපැවැත්වෙන සේ ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වීමට අනුමැතිය ලද අතර, 1999 අප්‍රේල් මස 15 දින 1ශ්‍රිලංසංඛ අණ හා පාලනයෙන් මිදි ස්වාධින ඒකකයක් ලෙස රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතට පත්විය.

2006 අප්‍රේල් මස 28 දින හවනි 15/2006 නගාසිටුවීමේ උපදෙස් මත නිළධාරීන් 21 දෙනෙකුගෙන් සහ සෙසුනිළයින් 464 දෙනෙකුගෙන් යුතු නව සංස්ථාව අනුමත වීමෙන් 2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය (සෙව්) නිදහස් ඒකකයක් ලෙස පෙරට යාමේ අත්තිවාරම දමන ලදි.

ඒ වන විටද නිත්‍ය සහෝදර ඒකක ජ්‍යෙෂ්ඨ නිළධාරීන් විසින් මෙම ඒකක අණදීම සිදු කරන ලද අතර, 2ශ්‍රිලංසංඛ (සෙව්) ප්‍රථම අණදෙන නිළධාරි වීමේ භාග්‍යය උදා වුයේ මේජර් ආර්ඩී කරුණාරත්න 1ශ්‍රිලංසංඛ වෙතය. ඉන් ඉතා කෙටි කාලයක ඇවෑමෙන් ලුතිතන් කර්නල් එම්පිඑච්එස්කේ පටබැදිගේ - 4ශ්‍රිලංසංඛ (එවකට මේජර්) විසින් අණදෙන නිළධාරි පදවිය භාරගන්නා ලදි.

එහෙත් මාසයක් වැනි සුළු කාලයකදි ඔහුට විදේශ පාඨමාලාවක් හැදෑරීම සඳහා දිවයිනෙන් බැහැරව යාමට සිදුවීමෙන් අනතුරුව 2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) ඉතිහාසයේ ප්‍රථම සෙව්විජා අණදෙන නිළධාරි වීමේ භාග්‍යය හිමිකර ගනු ලැබුයේ මේජර් එල්ජේසී ද පීරිස් - 2ශ්‍රිලංසංඛ(සෙව්) විසිනි.

ස්ථිර පදනමකින් තොරව, ස්ථිර අධිෂ්ඨානයක් නොමැතිව අපැහැදිලි අනාගතයක සිහින දකිමින්, ජ්‍යෙෂ්ඨයන්ගේ අනාගත සිහින බිඳ වැටෙනු දකිමින් කල් ගෙවු පරපුරක බලාපොරොත්තු සහිත හෙට දිනයක අරුණළු තුලින් නව ජිවනයක උදාව එතැන් සිට දැකගත හැකිවිය.

වත්මන් අණදෙන නිළධාරිගේ නිවැරදි මගපෙන්වීමට අනුව නිළධාරි මඬුල්ල හා සෙසුනිළයින් සහෝදරත්වයෙන් එකමුතුව එකාවන්ව කටයුතු කිරීමේ ප්‍රථිඵලයක් වශයෙන් අද සෙසු නිත්‍ය සහෝදර ඒකකයන් අතර අද්විතියව වැජඹෙන්නට 2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) ඒකකයට හැකියාව ලැබී ඇත.

ඒ අනුව වත්මන් ඒකක සංයුතිය නිළධාරීන් 12 දෙනෙකුගෙන් හා සෙසුනිළයින් 340 කින් සමන්විතව සාර්ථක අනාගතයක් වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් පවති.

2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) ඉතිහාසයේ ප්‍රථම වරට අද සෙසුනිළයින්ගේ මගපෙන්වන්නා ඒකකය තුලින්ම පැමිණි රෙජිමේන්තු සැරයන් මේජර් වරයෙකි. රෙජිමේන්තු උපකරණ පාලක සැරයන් මේජර් වරයාද එවැන්නෙකි. මෙය සෙසු අයට ඒකක ඉදිරි අනාගතයේ සෞභාග්‍ය පෙන්වන පෙර නිමිතිය.



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008

උප අණදෙන නිළධාරි සහ විධායක අධිකාරිද 2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) මාතාවගේම දරුවෝය. අද 2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) ඒකකය අපේය. හෙටද අපගේමය. ඒ අප ඒකක මාතාවගේ ස්වාධිපත්‍යයේ කාහල නාදයයි.

2008 අප්‍රේල් මස 25 වන දින අප ඒකක මාතාවගේ විසිඅටවන ජන්ම දිනය නිදහස්ව සෙවරී උත්කර්ෂවත් අන්දමින් සමරමින් එහි ප්‍රධාන අංගය වන සම්මාන පෙළපාලියේ උත්තමාචාරය අණදෙන නිළධාරි වෙත පිරිනැමුවේ ඉමහත් භක්තියෙකිනි. එය අපට මහත් ගෞරවයකි, 2 ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) ඉතිහාසයේ නොමැකෙන සිහිවටනයකි.

එසේම අපට දෙපයින් ස්වාධිනව නැගි සිටින්නට එදත් අදත් කවදත් අත හිත දුන් සංඥා බළකාධිපති වරුන්, බළසේනාධිපති වරුන්, මධ්‍යස්ථාන සේනාවිධායක වරුන් ඇතුළු සියලු සංඥා ඒකකවල ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිළධාරීන් ඉමහත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නට මෙය අවස්ථාවක් කර ගනිමි.



කා:නි: අණදෙන නිළධාරි හට 28 වන ඒකක සංවත්සරය වෙනුවෙන් පිරිනමන ලද සම්මාන මුරය පරීක්ෂා කිරීම



28 වන ඒකක සංවත්සරය වෙනුවෙන් කා:නි: අණදෙන නිළධාරි හට පිරිනමන ලද සම්මාන පෙළපාලිය පරීක්ෂා කිරීම

# මතක පොතින්

## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ පසුගිය වසරේ මතක සටහන්



සංඥා බලකාධිපති මේජර් ජේනරාල්
වයිඑච්ස් ද සිල්වා යූඑස්පි පීඑස්සී සමුගැනීම



නව සංඥා බලකාධිපති
බ්‍රිගේඩියර් ටීඑෆ් මීඩින් ආර්එස්පි එල්ඩීඑම්සී
වෙනුවෙන් පැවැත්වූ සම්මාන මුරය.



නව සංඥා බලසේනාධිපති
කර්නල් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී
පීඑස්සී යූඑස්ඒසීජීඑස්සී
වෙනුවෙන් පැවත්වූ සම්මාන මුරය



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස
කර්නල් ආර්එච්ස් රණසිංහ යූඑස්පී
වැඩභාරගත් මොහොත



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008



## 1 වන සංඥා රෙජිමේන්තුවේ. පසුගිය වසරේ මතක සටහන්



ආසේමු (නැ) ආඥාපති මේජර් ජෙනරාල්
ජේජේපීඑස්ටී ලියනගේ ආර්එස්පි යූඑස්පි එන්ඩීයි
අයිපී එල්ඩීඑම්සී වෙත සම්මාන මුරයක් පිරිනැමීම.



උ නාදෙණ නිළධාරී විසින් ඒකක 64 වන
සංවත්සරයේ සම්මාන මුරය පරීක්ෂා කිරීම.



ඒකක සමූහ ඡායාරූපය



තොප්පිගල කඳු මුදුනේ අළුතින් ඉදිකල
සංඥා සම්බන්ධතා කුළුණ පරීක්ෂා කිරීම.

# 3 වන සංඥා රෙජිමේන්තුවේ. පසුගිය වසරේ මතක සටහන්



අණදෙන නිලධාරී තුමා විසින් සියළු නිලයින් ඇමතීම



ජය ශ්‍රී මහා බෝධිය අභියස බෝධිපූජාව



අණදෙන නිලධාරී විසින් රණවිරු දෙමාපිය/ දූදරුවන් ඇමතූ අවස්ථාව



සියළු නිලයින්ගේ දිවා භෝජන සංග්‍රහය





# 4 වන සංඥා රෙජිමේන්තුවේ. පසුගිය වසරේ මතක සටහන්



අණදෙන නිලධාරී තුමා සියලු නිළ දිවා භෝජන සංග්‍රයට එක් වෙමින්



සියලු නිළයින් අණදෙන නිලධාරී තුමා සමග දිවා භෝජන සංග්‍රහයට එක්වෙමින්



අණදෙන නිලධාරී තුමා දිවා භෝජන සංග්‍රහයේදී සියලුම නිළයින් අමතමින්



ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සියලු නිළ සාදයට එක් වෙමින්

# 5 වන සංඥා රෙජිමේන්තුවේ. පසුගිය වසරේ මතක සටහන්

රට දෙකඩ කරවීමේ දැඩි අරමුණින් රුදුරු ත්‍රස්තවාදීන්ගේ එල්ලවන ප්‍රහාර මැඩපැවැත්වීම හේතු කොට ගෙන සිදුවූ යුධ හමුදා ව්‍යාප්තියත් සමගම ඊට සමගාමීව 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ආධාරක බළඇණියක් වශයෙන් පාබල රාජකාරිය ඉටුකිරීම පිණිස 1994 ජනවාරි මස 02 වන දින දේවහුව යුධහමුදා කඳවුරේදී අභිනවයෙන් නඟා සිටුවීමෙන් පසු ක්‍රියාන්විත රාජකාරි සඳහා 23 සේනාංකයට අයත් බලසේනා කිහිපයක් යටතේ පුනානී, වාලච්චේන, කල්කුඩා, මඩකලපුව, කල්කුඩා, මාන්කරනි, සිංහපුර, මඩකලපුව, මාන්කරන්, නාවල්අඩි, කල්ලඩි, සතුරුකොන්ඩාන්, මඩකලපුව යන ස්ථානයන් හි ක්‍රියාන්විත රාජකාරීන් ඉටුකරන ලදි. වර්ෂ 12 කට අධික කාලයක් ක්‍රියාන්විත රාජකාරීන් 23 සේනාංකය යටතේ සිදුකර 2006.10.26 දින සිට 22 සේනාංකය බල ප්‍රදේශයට අයත් මාවිල්ආරු ඉදිරි ආරක්ෂක වළල්ලේ රාජකාරි සඳහා බලඇණියක් යොදවන ලදි.

මාවිල් ආරු සොරොව්ව කොටි ත්‍රස්තවාදීන් අතට පත්වීමෙන් අනතුරුව ප්‍රදේශවාසී ජනතාව තුළ පැවති ව්‍යාකූල තත්වයන් සමථයකට පත්කරගැනීම සඳහා 22 සේමු වෙතින් සොරොව්ව මුදාගැනීමේ මෙහෙයුමක් දියත් කරන ලද අතර මේ සඳහා මෙම ඒකකය වෙතින් ද භට පිරිස් ලබා දීමට සිදුවිය. ඒ අනුව 2006.08.24 දින මාවිල් ආරු සහ වෙරුගල්ආරු මුදවාගැනීම මෙහෙයුම් සඳහා මෙම ඒකක බී කණ්ඩායමේ සහ සී කණ්ඩායමේ භට පිරිස් සහභාගී කරවන ලද අතර, මොවුන් මේ සඳහා සහභාගී වූ අනෙකුත් පාබල ඒකකයන් සමඟ එකතු වී කටයුතු කර මාවිල්ආරු සොරොව්ව ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදවා ගැනීම සඳහා ක්‍රියාකරන ලදි.



2008.02.14 දින ලුතිනන් කර්නල් පිජ්ජේ පීරිස් විසින්
ලුතිනන් කර්නල් ඩබ්ළු ප්‍රේමසිරි වෙතින්
අණදෙන නිළධාරි තනතුර භාරගැනීම



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008
මතක පොතින්

# 6 වන සංඥා රෙජිමේන්තුවේ. පසුගිය වසරේ මතක සටහන්



සංඥා බලකාධිපතිතුමාගේ ඒකක සංචාරය



52 සේනාංකාධිපති තුමාගේ ඒකක සංචාරය



6 ශ්‍රීලංසංබ නව අණදෙන නිළධාරී
ඒකක පුහුණු වීම් පරීක්ෂා කිරීම



ඒකක අණදෙන නිළධාරී භට පිරිස් ඇමතීම



කිලාලී ඉදිරි ආරක්ෂක වලල්ලේ බංකර් අළුතින් ඉදිකරන 6 ශ්‍රීලංසංබ සෙනින්

# 7 වන සංඥා රෙජිමේන්තුවේ පසුගිය වසරේ මතක සටහන්



ඒකක අණදෙන නිළධාරි මේජර් ඩීබීසී ජයසිංහ පීඑස්සී වෙත සම්මාන මුරයක් පිරිනැමීම.



ඒකක සමූහ ඡායාරූපය



සිදුකරන ලද ක්‍රියාන්විතයකදී ත්‍රස්ටවාදීන් පන්නාදමා අත්පත් කරගත් බංකරයක්



සංඥා බළකාධිපති 2008/06/17 දින ඒකක සංචාරයේදී හමුපිරිස් ඇමතිම



සිදුකරනලද ක්‍රියාන්විතයන් හිදි ලබාගත් ත්‍රස්ටවාදීන්ට අයත් අවි



සිදුකරනලද ක්‍රියාන්විතයන්හිදි ත්‍රස්ටවාදීන් විසින් වලදමා තිබූ අප විසින් ඉවත් කරනලද පුද්ගලිකනාශක බිම්බෝම්බ



ත්‍රස්ටවාදීන් විසින් වලදමා තිබූ අප විසින් ඉවත් කරනලද පුද්ගලිකනාශක බිම්බෝම්බ හා මර උගුල්





# 8 වන සංඥා රෙජිමේන්තුවේ පසුගිය වසරේ මතක සටහන්



නව අණදෙන නිලධාරීතුමා හට පිරිනැමූ . උත්තමාචාර පෙළපාලිය



නව අණදෙන නිලධාරීතුමා සියළු නිලයින් ඇමතීම



අණදෙන නිලධාරීතුමා විසින් රාජකාරි භාරගැනීමට පෙර පොල්තෙල් පහන දැල්වීම



ක්‍රියාන්විතයක අවස්ථා

## 9 වන සංඥා රෙජිමේන්තුවේ. පසුගිය වසරේ මතක සටහන්



ජය ශ්‍රී මහා බෝධිය අනුරාධපුරයෙහි පැවැත්වූ ඒකක ධජයට සෙත්පැතිමේ පූජාව



සංඥා බලකාධිපති බ්‍රිගේඩියර් ටීඑෆ් මිඩින් ආර්එස්පි එල්ඩීඑම්සි විසින් ඒකක ධජය ඔසවන අයුරු





## සංඥා මූලික වැඩපළ පසුගිය වසරේ මතක සටහන්

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ 60 වන නිදහස් සංවත්සරය නිමිති කොටගෙන බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී පවත්වන ලද දැයට කිරුළ ප්‍රදර්ශණය සඳහා ශ්‍රී ලංකා සංඥා බළකාය නියෝජනය කරමින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටිය සියලු දෙනාගේ සිත් ඇද බැද ගන්නා ලද අතර එහි දි තොරතුරු තාක්ෂණය සහ නවින සංනිවේදන තාක්ෂණයන් පිළිබදව ජනතාව දැනුවත් කරන ලදි.






පකිස්ථානයේ NRTC ආයතනයේ මුල්‍යමය දායකත්වය මත සංඥා මූලික වැඩපළෙ හි PRC 9600 ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ අංගයක් ස්ථාපනය කරන ලද අතර එය 2008/01/17 වන දින සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් වයිඑස්ජී ද සිල්වා යුඑස්පි පීඑස්සි විසින් විවෘත කරන ලදි.





උතුරු නැගෙනහිර සිදුකල සහ සිදුකරමින් පවතින ක්‍රියාන්විතයන් හිදි සංඥා මූලික වැඩපළ හා ඊට අනුබද්ධිත 1 3 සහ 4 වන සංඥා රෙජිමේන්තු වල ස්ථාපිත කර ඇති ක්ෂේත්‍ර වැඩපළ වල් මගින් සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරන ලද අතර වන්නි ප්‍රදේශය මුදා ගැනිමේ මෙහෙයුම් වල සංඥා සම්බන්ධතා පවත්වාගෙන යාමට ආධාරකයක් වශයෙන් නව සංඥා ක්ෂේත්‍ර වැඩපළක් ඉරට්ටපෙරියකුලම් ප්‍රදේශයේ ස්ථාපිත කරන ලදි.

# සංඥා පුහුණු පාසල පසුගිය වසරේ මතක සටහන්



සේනාවිධායක රාජකාරි නිමාවෙන් පසු නික්ම යන ලුතිතන් කර්නල් ඒඩීපී සෙනෙවිරත්න වෙනුවෙන් පැවති උත්තමාචාරය



2008.04.02 දින නව සේනාවිධායක වශයෙන් ලුතිතන් කර්නල් එන්පී අකුරන්තිලක සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් අයුරු



ආධුනික පුහුණු පාඨමාලාව අංක 32 හි විසිරයාමේ පෙළපාළියේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වූ ශ්‍රී ලංකාවේ බංගලාදේශ තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක කොමදෝරු ඒඑස්එම්ඒ අවාල් (ජී) එන්ඩීසී පීඑස්සී විසින් අතිශූර සෙබලාහට ත්‍යාග පිරිනැමීම



කොමදෝරු ඒඑස්එම්ඒ අවාල් (ජී) එන්ඩීසී පීඑස්සී හට සේනාවිධායක සංඥා පාසල විසින් සමරුඵලකයක් පිරිනැමීම



අළුතින් ස්ථාපනය කරන ලද පරිගණක විද්‍යාගාරය



නවීකරණය කරනලද සංඥා පාසල් ශ්‍රවණාගාරය



නවීකරණය කරනලද සංඥා පාසල් දුරකථන සහ රැහැන් විද්‍යාගාරය



නවීකරණය කරනලද සංඥා පාසල් ගුවන්විදුලි විද්‍යාගාරය



අළුතින් ඉදිකරණ ලද මුරපල

# 2 වන (සෙවි) ශ්‍රීලංසංබ ඒකකය පසුගිය වසරේ මතක සටහන්



ඒකකයේ 28 වන සංවත්සරය වෙනුවෙන් පනාගොඩ යුධ හමුදා ශ්‍රී බෝධිරාජාරාමයේදි පැවැත්වූ බෝධි පූජාව සඳහා ඒකක අණදෙන නිළධාරී, දෙවන අණදෙන නිළධාරී, විධායක අධිකාරී ඇතුළු නිළධාරී / සෙසුනිළයින් සහභාගි වූ අයුරු



යුහව්පි දියතලාව වෙතින් පැවැත්වූ සරඹ උපදේශක පාඨමාලාව අංක 86 හි පළමු ස්ථානය හිමිකරගත් සෙ/2සි00493 මා/සැරයන් ගුණතිලක පිඩිඑස්



සටන් පුහුණු පාසල අම්පාර වෙතින් 2008.04.21 වන දින සිට 2008.07.03 වන දින දක්වා පැවැත්වූ කණිෂ්ඨ උපදේශක පාඨමාලාව අංක 56 (පිරිමි) හි පළමු ස්ථානය හා සෑම අතින්ම අතිශූර සෙබළාට හිමි සම්මානය හිමි කරගත් සෙ/2සි00559 ලා/කෝ දේශප්‍රිය එල්ජේපි



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008

# ක්‍රීඩා ජයග්‍රහණ



සෙ/277506 කෝප්‍රල් රාජපක්ෂ ආර්ඒඑස්ඒ - තොතාඒ

2007 වසර ජාතික මහා ක්‍රීඩා උලෙල තරග ඇවිදිම තෙවන ස්ථානය, 85 වන ජාතික ශුරතා ක්‍රීඩා උලෙල තරග ඇවිදිම තෙවන ස්ථානය හා සබරගමු පලාත් ක්‍රීඩා උලෙල තරග ඇවිදිම ප්‍රථම ස්ථානය



# උත්තම පූජා

## ඔවුහු අප වෙනුවෙන් දිවි පිදුහ

**සෙ/276760 සැරයන් සමරකෝන් ඩීජීඒ - 1 ශ්‍රීලංසංබ**
2008.04.27 දින - චිත්තවලයාන්කඩ්ඩු හඳී

**සෙ/280656 ලා/කො සමන් ඩීජී - 1 ශ්‍රීලංසංබ**
2008.06.22 දින නොච්චිකුලම් හිදී

**සෙ/276609 ලුහිතන් දිසානායක ඩීකේසිටීපී -1 ශ්‍රීලංසංබ**
වවුනියාව - 2008.07.10 දින හිදී

**සෙ/275889 ල/කෝ ද සිල්වා ඩීඑස්ටී - 3 ශ්‍රීලංසංබ**
2008.02.12 දින තල්ලඩි - මන්නාරම හිදී

**සෙ/279668 ල/කෝ තිස්සදෙනිය එම්ටීපීඑන් - 4 ශ්‍රීලංසංබ**
2008.08.16 දින ඉරන්ඩිකුලම් හිදී

**සෙ/165187 ලා/කෝ අජිත් බණ්ඩාර කේපීපී - 6 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.01.06 දින කිලාලි දී

**සෙ/29577 ලා/කෝ සම්පත් පීඑල් - 6 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.01.06 දින කිලාලි හදී

**සෙ/29577 ලා/කෝ ගිණිගේ බීකේඑස් - 6 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.05.31 දින කිලාලි හිදී.

**සෙ/281347 ලා/කෝ රණසිංහ ආර්ඒජේ - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.06.01 දින නොච්චිකුලම් හිදී

**සෙ/281392 ලා/කෝ තිලකසිරි පීඑච්එන් - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.06.04 දින නොච්චිකුලම් හිදී

**සෙ/280636 ලා/කෝ ගමගේ එච්පීඑන්එස් - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.06.22 දින නොච්චිකුලම් හිදී

**සෙ/279714 ලා/කෝ කුමාර ටීඑම්ඩබ්ලිව් - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.06.22 දින නොච්චිකුලම් හිදී

**සෙ/280329 ලා/කෝ ලක්සිරි කේඒඅයි - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.06.22 දින නොච්චිකුලම් හිදී

**සෙ/279833 ලා/කෝ දහනක පීපීජීඑස්ටී - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.06.04 දින් නොච්චිකුලම් හිදී.

**සෙ/275821 සැරයන් පුෂ්ප කුමාර එල්එල්ආර් - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.07.09 දින නොච්චිකුලම් හිදී

**සෙ/281338 ලා/කෝ රාජකරුණා ආර්එම්එම් - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.07.09 දින නොච්චිකුලම් හිදී.

**සෙ/279866 ලා/කෝ ප්‍රේමරත්න පීඑන්පී - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.07.10 දින නොච්චිකුලම් හිදී

**සෙ/278069 ලා/කෝ නිලන්ත බණ්ඩාර පීඑම් - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.08.16 දින නොච්චිකුලම් හිදී

**සෙ/280657 ලා/කෝ සංජීව කුමාර ආර්එම්ඒ - 7 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.09.16 දින නොච්චිකුලම් හිදී.

**සෙ/183649 ලා/කෝ වන්නිආරච්චි පීපීඑස් - 8 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.08.27 දින නොච්චිකුලම් හිදී.

**සෙ/279752 සැරයන් බණ්ඩාර ටීපීඑල් - 10 ශ්‍රීලංසංබ (ආ/ම)**
2008.09.12 දින මානක්කුලම් හිදී.

**සෙ/279752 ලා/කෝ රණසිංහ එම් - තොතාව්**
2008.02.12 දින තල්ලඩි - මන්නාරම හිදී

**සෙ/276355 සැරයන් මාකලන්ද එස්එස් - සංමුවැ**
2008.09.08 දින වවුනියාව හිදී

**සෙ/2සි00497 මා/සැරයන් ජෝර්ජ් ජේ - 2 ශ්‍රීලංසංබ (සෙව්)**
2008.02.19 දින තල්ලඩි - මන්නාරම හිදී



THE SIGNALLER
Sri Lanka Signal Corps Journal - 2008

# කැම්පත් පැවුර

## තොප්පිගලයි රණවිරුවයි

තොප්පියෙ හැඩය ගත් කන්දකි    තොප්පිගල
මහ ඝණ කැලෑවට මැදිවුණු    තොප්පිගල
ලෝකෙම දරුණු කොටි රජ කල    තොප්පිගල
හමුදා සෙබළු දැන් වැජඹෙන    තොප්පිගල

නැවතත් ත්‍රස්ත වැඩ එන්නට ඉඩ    නොදෙමු
සාමය සතුට පතුරන්නට වැඩ    කරමු
ඉතිහාසයට රන් අකුරින් මෙය    ලියමු
පැරකුම් යුගය වෙත මේ රට අරන්    යමු

රජවී සිටිය රජවරු අපි සිහි    කරමු
ජනපති තුමා දුටු ගැමුණුට සම    කරමු
වෙන්වී තිබෙන රට නැවතත් එක්    කරමු
ත්‍රි සිංහලය යලි එක් සේසත්    කරමු

එඩිතර නායකත්වය මත ජය    ගත්තා
රණවිරුවන් නිසා මේ ජය ලැබ    ගත්තා
බියකරු කොටින් මෙය අතහැර පැන    ගත්තා
අසරණ මිනිසුන්ගේ මරබිය සිඳ    ගත්තා

සෙ/279993 සංසෙ කොළඹගේ එස්යු
232 බසේමු තාරාවිකුලම්
තොප්පිගල - 1 ශ්‍රීලංසංබ

## වෙසක් උදාව

දහසක් පැතුම් ඉටුවන පින්බර    දිනක
සොයුරිය ඔබව සිහි වෙනවා නිතර    මට
සාමය සතුට ඇති කෙරුමට තිබේ    මට
මේ ගැන සිතා යනු මැන බුදු හිම    ලගට

වෙසක් සිසිල හැම හද තුල ඇති    වේවා
එපින් බලෙන් සැමගෙම දුක් දුරු    වේවා
සදහම් එළිය සිරිලක තුල වැජ    බේවා
මගේ සොදුරටත් මා නැති දුක    නොදැනේවා

බුදුහිමි ලගට යමු වෙසගට අපි    දෙන්නා
කියලා ලියපු ලියමන අද දින    ලැබුනා
දෙපලක ඉදන් සිටියත් සෙනෙහස    පෙන්නා
කෙලෙසක වදින්නද බුදුහිමි අපි    දෙන්නා

සෙ/278625 ලා/කෝ කරුණාරත්න එම්ඩීසි
232 බසේමු "සංඥා අංගය"
තාරාවිකුලම් - තොප්පිගල - 1 ශ්‍රීලංසංබ

## හෙට දවස

හිරු නැගෙන මේ හෝරාව
සද බසිනා මේ සැන්දෑවේ
කාන් කවුරුත් නැති
මේ පාලු තල්වැට ලග
ඉමක් කොනක් නොමැතිව
බලා ඉදිමි මා ......................//
සාමය උදාවන තුරු ............

සෙ/280015 සංසෙ ප්‍රේමශාන්ත
පීවීම්වස්

## සොයුරාට උපහාර

මල්ලිගෙ අතින් අල්ලාගෙන අයියේ    ඔයා
මතකයි වෙල් යායෙ විදුහල වෙතට    ගියා
මව් බිම රැක ගන්න ඕනෑ කියල    ඔයා
ඉගෙනුම නිමාකර යුධ පෙරමුණට    ගියා

තොප්පිගල කියනා පොඩි    ගලේ
මගෙ සුදු අයිය එඩිතර සටනක    යෙදුණේ
සතුරන් අතින් වෙඩි පහරක් එල්ල    වුණේ
ඒ වෙඩි පහරෙනුයි අයියා නිහඬ    වුණේ

වසර තුනක් අවුරුදු මාසෙට    ගෙවුනා
මතක තුනක් ලෙස අප හදවත    දැවුනා
මව්පිය දෙදෙනා සමගින් අක්කලා    දෙදෙනා
මෙලෙස වැලපෙනවා එක මල්ලියේ    කියා

සෙ/276275 සැරයන් ආරියරත්න
232 බසේමු සංඥා අංගය
තාරාවිකුලම් - තොප්පිගල - 1 ශ්‍රීලංසංබ

# සෙබළ හිමියනි

නුඹගේ තුරුණු විය
හිරකර යුධ බිමට
නුඹ ගෙවනා ජිවිතේ
අනුහසක් මව් බිමට
දිරි ගන්න හෙට දිනේ
යුධ ගිනි නිවන්නට
මම හිඳිමි එන මගේ
ජය පැන් ඉසින්නට ''''''''

සෙ/278420 සංසෙ විරසිංහ ඩීඑස් ගේ බිරිඳ
අංක 361/බී - දමනේවෙල - ළිහිණියාගම

# යුධ ගිනි නිවී සාමයයි සපිරි රටක්

සාමය නැමැති රන් මාලය පලදින්න
ගිනි අවි වලින් අපි සැමදෙන වෙන්වන්න
සාමය උදාවී සැම සිත් පැහැදෙන්න
සිරිලක් මවුනි රටටම සාමය දෙන්න

නැගෙනහිරට ආ සාමය උතුරුකරෙත් පැතිරේවා
උතුරෙ සිටින ජන ජිවිත සාමයෙ මල් පිදේවා
ගිනි අවි හඩට හදගැස්මක් හැමදෙනගෙම නැතිවා
බුදු සමිඳුගෙ පාමුල අපි නිර්වාණෙන් සැනසේවා

සෙ/275604 සැරයන් ජයසුරිය ඒඑම්
232 බසේමු - සංඥා අංගය
තාරාවිකුලම් - තොප්පිගල - 1 ශ්‍රීලංසංබ

# සිතුම් පැතුම්

සිටියත් ඔබ ඈත දුරක
පවනේ එයි ඔබේ සුවඳ
තනිවී මා හිඳින වේලේ
තතු පවසයි මගේ කනට

රෑ අහසේ සඳ බලන්න
තනිවී සිත තරු ගනින්න
මට ආසයි හැමදාමත්
ඔබේ ලගට වී සිටින්න

සෙ/276753 කෝප්‍රල් ගුණරත්න ඒඒආර්ඒ
232 බසේමු සංඥා අංගය
තාරාවිකුලම් - තොප්පිගල - 1 ශ්‍රීලංසංබ

# මගේ මව් බිමේ
## පොසොන් අසිරිය

මිස්සක පව්වට - අනුබුදු හිමියන්
වැඩම කලේ අද වැනි දිනකයි
මුව දඩයමේ ගිය පැතිස් නිරිඳුන්
හිමිගේ වදනට මවිත වුනේ

හිමි ඇසු පැනයට රජ පිලිතුරු මත
දහම් එලිය ලක පැතිර ගියේ
ලක් බුදු දහමේ ඇරඹුම සිදුවු
පොසොන් උදාවු දිනය අදයි

මිනිස් කමේ ගුණ හා දිවි පැවතුම්
බොදු සිත් දහමින් අවදි කලේ
වැව දාගැබ හා ගම පන්සල කෙත
බොදු මිනිසුන්ගෙන් ඉදි කෙරුණේ

සෙ/279995 සංසෙ වනසිංහ ඒඒකේ
232 බසේමු සංඥා අංගය
තාරාවිකුලම් - තොප්පිගල - 1 ශ්‍රීලංසංබ

# සෙනෙහස

ඉස්සර දවසක ඔයාගේ දසුනින්
මගේ හදවත මලක් වගේ පිබිදුනා
මොහොතින් මොහොත ලස්සන වුනා
මගේ ජිවිතය
පාට පාට දේදුන්නක් වගේ
කියන්න බැරි තරම් සතුටකින්
මම ඔයාට තුරුළු වුනේ
ගසක එතුන වැලක් වගෙ
තාමත් ඒ උණුසුම මට දැනෙනවා
මා ඔබ ලගයි මට නිතරම සිතෙනවා
ඔබ පෙනෙයි නොපෙනන විටත්
ඔබ සිතෙයි නොසිතෙන විටත්
දැනෙයි නොදැනෙන විටත්
මේ හැමදේම ඔබ හට ඇති ආදරේ නිසයි

සෙ/279995 සංසෙ වනසිංහ ඒඒකේ
232 බසේමු සංඥා අංගය
තාරාවිකුලම් - තොප්පිගල - 1 ශ්‍රීලංසංබ





# ඇයස් අමතක වෙන්න නම්

බොහෝ කවි සිංදු
සදැස් නිසදැස් ලියන මට
නුඹ ගැනත් මෘදු සිතින්
සිත් කවක් ලියන්නට තැත් කලෙමි

වචනයෙන් වචනය පේලියට ලියුවත්
නිමාවක් නොමැත මා......
වෙත ඔරවන ඇස් අතර
ඔය තරමට කාන්තිමත් ඇස් දෙකක්
පුදුමයි........
පන්හිඳ තබමින් සිතුවෙමි
නුඹ ගැනම
යලිත් පන්හිඳ තබන්නට පෙර
පවසන්නෙමි මා.......

නුඹ තරම් ලස්සනට මා නොසිතුවත්
නුඹ තරම් ලස්සනට මා නොලිවත්
නුඹ තරම් ලස්සනට මා නොදැක්කත්

# ආදරණීය ඔබ

පතා ආ ලෙස පෙර සසරේ
හමු වුනේ ඔබ මට මේ සසරේ
ලබැඳි පෙම්වතියකි මට
වරෙක මවකි ඔබ මට
විටෙක සොහොයුරියෙකි
දයාබර බිරිඳකි
දිවිමගේ පහන් ටැඹ
ඔබය
රකිමි ඔබ
පතනෙමි ඔබ
මතු සසරෙදිත්............

කෝප්‍රල් නෙත්තිකුමාර එන්ඒපි
තොතාඒ

# ප්‍රේමයෙන් වෙන් වී යාම

ඔබට ප්‍රේමය පුදකල දවස මතකද
එදා මුල පිරූ ආදරේ
මම ඔබට හද පත්ලෙන්ම දුන් ප්‍රේමය
බිඳී ගියේ
නිරාශයකින් කාලයේ
ඔබ මටද වෙන පෙම්වතෙකුටද කල
රහසක් විය
ජිවිතේ
ගැහැණිය ඇයි මෙතරම් චපල වුනේ
දෙදෙනෙකුට බෙදෙන්නට
ඒ ආදරේ
ඔබේ ප්‍රේමය චපල ආලය ඇයි මෙලෙස
මගේ නිමල හදවත රිදවුයේ
හුදකලාවී වේදනාවෙන් සිටින්නම්
ඔබට පුදකල ආදරය නාමෙන්
ජිවිතේ

සෙ/66701 කෝප්‍රල් පෙරේරා එච්ඩීඑල්
3 ශ්‍රීලංසංබ - පලාලි

# සෙබල සිත

ගෙවනා ජිවිතේ
තල් වැට මායිමේ
තනිකම වෙලාගෙන
අඳුර ගලනා වේලේ
පාළුව මකන්නට
සිතුවිලි නිවන්නට
සිත් පිත් නැති අවිය
සෙනහසින් ලග හිඳි

මඳ නලට අත වනන
පුංචි සඳ සාවියේ
තරු කැට පිරිවරා
නුඹ ලෙවන ජිවිතේ

පිණිකැට වැහෙනා
මල් පිපෙන රාත්‍රියේ
නුඹලා නමින් හිනහෙන්න
මා සිතට දිරි දෙන්න

සෙ/278420 සංසෙ වරසිංහ ඩීඑස්
සංඥා අංගය - නිඅහපි (අම්පාර

65

# පියෙකුගෙ කඳුළු

මවගේ ඇකයෙ සිටිනා මගෙ පුංචි පුතේ
පිය සෙනෙහසේ අඩුවක් දැනෙනවද පුතේ
ඔබ වැනි තවත් දරුවන් රැකගන්න පුතේ
නුඹගේ පියා උතුරේ යුධ බිමේ පුතේ

සිහිවන විට ඔබේ ලස්සන මුව මඩල
හදවත හඩා වැලපෙනවා මගෙ නිමල
හමනා මදපවන ගස් වැල් යන සොල්ල
මගෙ පොඩි පුතුට සලසාපන් පවනැල්ල

මවගෙන් නිතර පියතුම ගැන අහන් නෙපා
අම්මා එපා කියනා දෙය කරන් නෙපා
අම්මගෙ දෑසෙ කඳුලැලි ඇයි අහන් නෙපා
පියතුම සිහිවෙලා මා පොඩි පුතු අඬන්නෙපා

නිවාඩුවක් ලැබෙනා විට දින ගනිමින්
සිත ලතවෙන්නෙ සැම විට නුඹ ගැන සිතමින්
සිතේ තියෙන සැමදුක් නුඹෙ දුරු වියන්
මගෙ පොඩි පුතා හට මා සිහිනෙන් පෙනියන්

අම්මයි ඔයයි දෙන්නාවම රැක ගන්ට
ඉන්නේ පුතේ මා ඔබගෙන් වි දුරට
අම්මට කිකරුව ඉන්නා පොඩි පුතුට
තිස් තුන් කෝටියක් දෙවි රැක වරණයි පුතුට

සෙ/184328
ආසෙ විජේසූරිය ඩබ්ඵ්එම්පී
2 වන සංඥා බලකාය(සෙවි)

# මිතුරු හද

ගව් ගණන් දුර ගෙවා
සසර නිම්තෙර සොයා
බුදු රදුන් වැඩිය බිම
මේ කිමද වී ඇත්තේ.....

එකිනෙකා ඇන කොටා
ගන්නවා පුද බිමේ
සොයුරු කැල රුදුරු වී
අවි අතින් අමෝරා...

නැවත අප කවදාද
එක්වන්නේ පෙර ලෙසින්
සිනහ මල් දම් මැදින්
සිතින් සිත යා කරලා.....
අතින් අවි බිම දමමු
සෙනෙහසින් වැළඳගමු
ඉඳිමු අප පෙර ලෙසින්
සහෝදර බැති පෙමින්.........

සෙ/2සී00702 සංසෙ කුමාර
ඩීඑස්ආර්එස්
2 ශ්‍රීලංසංබ (සෙවි)

# යුද්ධයේ කලාව

යුද්ධයත් එක්තරා කලාවක්
නමුත් නැහැලු වෙලාවක් කලාවක්
ඝණ කළුවර හිමිදිරි පාන්දර
ගිනි මද්දහනේ සීතල උදෑසනේ
නැහැ කිසි දිනක ඒකෙ වෙනසක්
තැබුමට යුද්ධයට ඉරක් තිතක්
කැපවී රකිමු සොයුරනේ
නැහැ අපහට වෙනත් රටක්........

බනි 11 පියරත්න ආර්එම්
3 ශ්‍රීලංසංබ - පලාලි

# රට වෙනුවෙන් අපි



යුධ බංකරයක
කල් ගෙවනා මොහොතක
සිහියට නැගුණා තරුණ
ලෝකයේ දිවි පෙවෙත
ගෙන යන තරුණ කමේ
අවිය මත නිර්භීතකම
ගාම්භීරකම නිසා
අප සමග සතුරන් නසන්න
රටට සාමය ගෙන එන්නට

සෙ/279377
ලා/කෝ ප්‍රදීප් විකේඑන්
6 ශ්‍රීලංසංබ(ආ/බ)
බී කණ්ඩායම





# හැර ගිය අනාගතය



සිප් සතර හදාරා
විදුබිමෙන් සමුගෙන
දෙවනුවේ පා තැබුවේ
යුධ බිම වෙතටයි
බාධක කම්කටොලු මැද
ගෙන ගියෙමි යුධ බිමේ ජීවිතය
එන ලැහැබ සිටින විට
තනි කමට මගේ සිතට
පන් හිදෙන් අකුරු කර
ලියළුනෙමි අත් දැකිම් මට
ලියූ අත්දැකිම් දැක
පෙම් කලේ ඇය මෙමට
කිසිදා නොවෙනස් විලස
දෙවි රදුන් ඉදිරියේ දිවුරා
විරාමය ලද විගස
මමද ගියේ ඇය ලගට
අනාගතය ගැන
යමක් විමසා.........
නොසිතූ විලස ඇය
දුරස් වි යන මොහොත
විකෙන් වික ලං උනත්
නොදැන සිටියෙමි මම
නොසිතූ අනාගතය ගැන
ඇය ගත්ත තිරණය
අද ඇයද අසරණයි
අඳුරු වු අනාගතය
නොසෙල් වෙමි මගේ සිත
ඇත අනාගතයක් මට
අසරණ වු ඇය වෙත
නැවත එනු මැන
හැරගිය අනාගතය.......

සෙ/2සී00464 සංසෙ රංජිත් සුනිල් ශාන්ත කේඩී 2 වන සංඥා බලකාය(සෙවි)

# සෙනෙහස සුවඳයි නුඹෙ අම්මේ

65

කම්මුල වෙත නුඹ
සුරත තියාගෙන
පාර බලනවද මගෙ අම්මේ
අද හෙට වෙන් නෑ නුඹව දකින්නට
නොසලන් කඳුලැලි නුඹ අම්මෙ
මහ සයුරේ රැළි නැගෙනා තරමට
හැඩුවද නුඹෙ සිත මගෙ අම්මේ
එනමුත් මගෙ සිත නොසැලෙන්නේ අද
රණවිරුවෙකි නුඹෙ පුතු අම්මෙ
ඇහෙනවනම් සිත හඬන තරම් නුඹෙ
රුදුරු උනත් සතුරට අම්මේ
වාවන්ට බැරි දුකින් හඬනවා
දෑත හිස බදා උන් අම්මෙ
නුඹෙ සිත හඬවා සෙනෙහස හැරදා
යුධ බිම වෙත පිය මැන්නේ අම්මේ
නුඹට තරමටම රටට ආදරය
කල හින්දයි මගෙ සිත අම්මේ
නෙත් අග්ගිස්සෙන් කඳුලු බිඳු නැගී
දෝර ගලන්නට පෙර අම්මෙ
රෑ හිනෙන්වත් ඇවිදින් යනවද
ඉඳහිටවත් නෙතු අතරට අම්මෙ
මියදෙනනට පෙර රුදුරු රණබිමෙන්
මොහොතක් හරි ඇවිදින් අම්මේ
දෙපා වඳින්නම් නුඹේ ලග වැටී
එතෙරම් සුවඳයි සෙනෙහස අම්මේ

සෙ/280028 සංසෙ අසන්ත ජේඒඑම්
(3 ශ්‍රීලංසංබ)
525 බසේමු - කිලාලි

# අන්නා

දමිළ ✓ඩමාලාවකට සහභාගි වී පැමිණි
සොල්දාදුවෙක් සහ
මැදිවියේ මෝටර් සයිකලයක් තල්ලුකරමින් පැමිණි
දමිළ වැසියෙකු සමග
සිදුවූ සාකච්ජාව. (සත්‍ය සිදුවීමකි)

සොල්දාදුවා - අන්නා බයිසිකල් හේ සුන්දරම්
කාබලේටර් හේ ඩස්බින් ॥

දෙමළ වැසියා - ඔව් සර් කාබලේටරේ ලෙඩක්
ස්ටාට් වෙන්නේ නෑ.
හදාගන්න ගරාජ් එකකට යන ගමන්

මේජර් එම්පීසිබී ජයශාන්ත, 6 ශ්‍රීලංසංබ(ආ/බ)
නිඅ සි කණ්ඩායම

# මා සහ ඇය

මම සඳක් සේ පායා ආවෙමි
ඔබ සියපතක් වී පිපිහිනෙහිමි
මම බැස යන කල්හි
ඔබ පෙති හකුලා ගතිමි
මගේ හද හඩා වැටෙද්දි
ඔබ පර උනෙමි
මම සුසුම් කුණාටුවක් වූ කල්හි
ඔබ මිහිමත පතිත උනෙමි
මම ඉකිගසන විට
ඔබ කඳුලැල්ලක් උනෙමි

සෙ/277367 කෝප්‍රල් පද්මකුමාර RADI
සංඥ මූලික වැඩපල

## මගේ මව්බිම

දහසක් තරු අතරේ
එක පුන් සඳකි බැබලෙන්නේ
දහසක් වැලි කැට අතරේ
රන් මිනි කැටයකි ඇත්තේ
දහසක් බුදුවරු අතරේ
එක් බුදු කෙනෙකි මට ඇත්තේ
දහසක් රටවල් අතරේ
මගේ රට සැමදා බැබලෙන්නේ

සෙ/280072 සංසෙ කුමාරසිංහ ටිපීඒ
6 ශ්‍රීලංසංබ(ආ/බ) - බී කණ්ඩායම

## ඒදා මෙන් අදත්

තුරන් කරනට මිනිස් ජීවිත
හබා ලුහුබැඳ පැමිණෙති
වසන් කරමින් විනාශය
ගෙන එන බෝම්බද අටවති
නිවන්නට මෙම රුදුරු ගිනිදැල්
මවන වියරුව අවගති
සාමය ලැබූ දිනයෙදි
දැනේවා සුවය හදවතේ නිමනැති

සෙ/277984 කෝප්‍රල් ජේමන්ත පීඩබ්එන්
6 ශ්‍රීලංසංබ(ආ/බ)
වැටුප් අංශය
මුහමාලේ - යාපනය

## පේට් ලයිනර්

විහාර මහා දේවිය මෙන්
රට වෙනුවෙන් දියඹට බසිනා
වීර මාතාවනි පේට්ලයිනර්

රට රකිනා වීරෝධාර සිංහ පැටව්
දහස් ගණනක් කුස තුල හොවාගෙන
උතුරුකරයට රැගෙන යන ඔබ
කරනා සේවය
කියා නිමකල නොහැකි තරම්ය

ගුවනින් සහ මුහුදින්
ආරක්ෂක සේනාවෝ පිරිවරාගෙන
මහ මුහුද දෙබෑ කරගෙන
ආඩම්බර ලීලාවෙන් ඉදිරියටම ඇදෙන
මාතාවනි පේට්ලයිනර්
ඔබට සදා ජය !

සෙ/277043 කෝප්‍රල් වසන්ත කුමාර එන්ඩීඒ
3 ශ්‍රීලංසංබ - පලාලි

## වීර සෙබලෙකු

කඳුලු බිංදු හංගාගෙන
සුසුම් මැද දිවා රෑයේ
සිව්මසක් විඩාකර
නිමාකල පුහුණුවෙන්

කැපවුනෙමි සේවයට
මව්බිමේ ගෞරවයට
සේවයට කැපවෙමි
හෙට දිනෙත් හිඳිමි මම
වීර සෙබලෙකු විලස

සෙ/279646
සංසෙ සිරිසේන එස්පී
3 ශ්‍රීලංසංබ - පලාලි

## සුභ සාධනය

මුහුණ කලු කරන
ඇග පුරා කොල ඇතු බදින
බඩගාන රෝල් වෙන
දුවන පනින පෙරලෙන
රුධිරය දහඩිය කරන
එක අරමුනට යාමට උගන්වන
සෙබලගේ දිවි රකින
සෙබලුන්ට දෙන
හොදම සුභසාධනය
පුහුණුවයි.

මේජර් එම්පීසිබී ජයශාන්ත
6 ශ්‍රීලංසංබ(ආ/බ)
නිඅ සී කණ්ඩායම

## දෛවය

දෛවය මා කිනම් දේ අහිමි කලත්
ඔබ මගෙන් දුරස් නොවේයැයි
මගේ සිත මසිතට සිය දහස් වර කියයි
අහිංසක හැම විශ්වාසයි නම්
මේලොවේ කොහේ හෝ පුංචි තීරුවක
ඔයාටත් මටත්
සතුටින් ඉන්න වාසනාව ලැබේවි...

සෙ/280639 සාසෙ ජයලත් ටීඑම්ආර්
8 ශ්‍රීලංසංබ යු. හ. කඳවුර
කල්මඩු - වව්නියාව





## චූටි දුව

සුරතල් වදන් කිය කිය හිනැහෙන    විටක
මට සිහිවෙනව මගෙ ආදර සුදු    මැණික
දත් පෙන්නලා රවලා අඬනා    විටක
මගෙ සුදු මැණික නාඩන් හිනහෙන්    මැණික

අයියා එක්ක දඟරව    හඬන්නට
දක්ෂයි ඒත් බැහැ සිනහව    නගන්නට
අප්පච්චියා ඇවිදින් දුව    බලන්නට
පතනව සුභ දිනක් පියුමක්    පිපෙන්නට

දින සති මාස ගෙවෙමින් ලොව    කැරකෙනවා
සැම සංසාරෙකම අපි සැම    පැවතෙනවා
සසර වසන තුරු අපි සැම    එක්වෙනවා
සිහිනෙන් පවා මගේ නෙත් දෙක    ඇහැරෙනවා

අම්මා අයිය එක්කල සුදු දුව    ඉන්න
දැකුමට නැහැ නමුත් බැහැ දුක    වාවන්න
සතුටින් කිරි ඉතිරෙන්න අපි සැමටම    ඔන්න
එනවා ලඟ දිනක ඔබ සැම    බලන්න

## ලොකු පුතා

බස්සෙක් හඬනවා බය හිතෙනවා    අම්මෙ
කියලා මගේ පුතා කිවේ එක    පිම්මෙ
එදා නෙවෙයි අද අපි එක ලෙස    නැම්මෙ
මගේ ලොකු පුතේ රැකවරණයි ඔබ හට    අම්මෙ

පාසල වෙතට ඔබ යන විට අකුරු    කරා
දැනුනද තනිකමක් ඔබෙ ඔය සිතක    පුරා
නංගි සමග යන්න එපා පාර    පුරා
අප්පච්චියා එනවා ලඟ දිනක    සොරා

පොකුණක පියුම් පිපුනත් හැම    පරවෙන්න
ඉන් මල් එකක් දිදුලයි ලොව    නැහැවෙන්න
සාමය සතුට ගෙන කිරි පැණි    උතුරන්න
පතනවා පුතේ ඔබටත් තිසරණ    සරණ

තිබුනත් මොන තරම් සෙල්ලම් බඩු    එමට
ඉන් එක දෙයක් වත් නැහැ ඔබ ගෙන    සතුට
නංගි ලග සිටිනම් පුත ඒ ඇති    නුඹට
රජෙක් වෙන්න පුළුවන් නුඹ මේ    ලොවට

සෙ/277608
ලා/කෝප්‍රල් වීරකෝන් ටීඑම්එච්ඒ
5 ශ්‍රීලංසංබ



## අවසන් ලිපිය

**හිරු**
ගමන නවතා
විඩාව නිවන්නට
සැඟවී සැතපෙන
සෝබර හැන්දෑවේ

**නුඹ**
ගසකි ගිලිහෙනා
වියලි පතක් මෙන්
ගිලිහෙයි හනිකට
මා මනසින් .......

**සඳ**
වඩියි අහසට
සුපුරුදු විලසින්
සඳ දිය වගුරා
මිහිකත තෙමමින් .......

**නෙතු**
නොපියම් මින් මතු
සෙනෙහස් යදිමින්
නුඹ මා බැඳහුන්
කාලය අවසන් .......

**මුව**
පිපුන සිනා මල්
සොමිනස කැන්දූ
සුරඟන සිහිනෙන්
මිදුනෙමි සැනෙකින් .......

**මම**
පිවිසෙමි පොලොවට
දකිනෙමි කඳුලැල්
හෙලනෙමි සුසුමන්
මව්බිම වෙනුවෙන් .......

සෙ/279754
ලාකෝ විමලරත්න එස්ඒඩී
5 ශ්‍රීලංසංබ (ආ/බ)
"ඒ" කණ්ඩායම

## කඳවුරෙන් එපිට ලොව

මම දෙලොවක් අතර අතරමං වේවිද
ඔබමට දුරස්බව දැනදැනත් ඇයිද මේ
සිතට එදදිදි ඔබම සොයන්නේ

අසරණයි ඔබේ සිතගාව මමත්
අසරනයි මගේ සිත ගාව ඔබත්
කුමක් කරම්ද දුරස් බවට

සිත කීකරු නෑ සිතුවිලි ලඟදි
ගත කීකරු නෑ සිතුවිලි ලඟදි
කතාකරමු අපි මණසින් පමණක්

අපේ දුරස්බව සිතන් මවන්නට
මලක් වී හමාරයි ඔබ මට
සුවඳත් දුරස් වූ

රැඳෙන්නට ඔය ඇස්ගාව
කඳවුරෙන් පවුරු අමතක කොට
මොහොතකට
ආදරේ නමුත් කියන්නේ කෙලෙසකද
නුඹ මට දුරස්බව දැන දැනත්

## ජීවිතය

ඇල්මෙන් අකුරට ඇවිදින්
අකුරු ඇහිඳගෙන
කඳු මුදුනට නැග බලන්න
ජීවිතයේ උස

සෙ/2C00576
ලා/කෝ ගුණරත්න ඩීඑම් 8 ශ්‍රීලංසංබ (ආ/බ)
පරසන්කුලම් - වවුනියාව

## අවංක ආදරයේ අවිහිංසක සමුගැනීම

ආදරය නැමැති කුඩුවේ දමා
සෙනෙහස නැමැති අහර කවා
සතුට නැමැති පැන් පොවා
මා රැකගත් කිරිල්ලිය මා මෙසේ
ආදරය නැමැති කුඩුවෙන් මුදවා   හරින්නේ
මා රැකගත් කිරිල්ලියට මාගේ සිතේ
සෙනෙහසක් නැතුවා නොවේ
ඔබගේ අනාගතය මා සතු නිසාය

එනමුදු කෙදිනක හෝ ඔබ
මා සොයා එන්නේද
එදින මවිසින් ඔබව
සදාකල් සිරකරනු ඇත

සිතන්න වරක් නොව දෙවරක්
එවිට ඔබට හැඟේවි යමක්
ඒ අන් කිසිවක් නොව
ඔබ අදද මට ආදරය කරන බවයි

සෙ/281443
සංසෙ රත්නපාල *KVSP*
සංඥ මූලික වැඩපල

## දඩබ්බර සිත

දඟකාර ජීවිතය
කෙලිදෙලෙන් ගෙවුනු දින
මතකයට නැගුනේම
සෙබලෙකු වන්නටමය
හැගිම්බර සිතුවිලි
මතකයෙන් ඉවත්කර
සෙනෙහසින් එක්වුනා
යුධ හමුදා දිවියටම
හැමදාම දඩබ්බරයි
මේ දිවිය ගෙවනතුරු
සටන් කරමි මම
ජීවිතය ඇතිතුරා

සෙ/280802
සංසෙ අබේවික්‍රම *PG*
සංඥ මූලික වැඩපල

## අහිමි නොවන සෙනෙහස

අතේ තියාගෙන ඉන්නේ ගිනි අවිය
සිතේ නිතරම ඇත්තේ නුඹ ගැනය
සිහිනෙන් ඇවිත් නුඹ මා ලඟ සැතපේය
සිහිවන විට මට එන්නේ කඳුලැල්ය

මේ තරම් පව් කළේ අපි දුක් විඳින්නද
ආලය කලේ දෙතැනකව් සිටින්නද
අවරෝ උඩින් යනවා අපි නගින්නද
නිවාඩු නැතිකොට පඩියෙන් පලක්වේද

සෙ/280003
සංසෙ ශ්‍රී විතානගේ යූඑස්කේ
8 ශ්‍රීලංසංබ (ආ/බ)
පරසන්කුලම් - වවුනියාව

## නිවාඩුව

කඳුළු බිඳුවක් තියන් නෙතු අග
හිඳි තාමත් බලාගෙන මග
දුරස් කරමින් ඒ කඳුළු ගඟ
පුතා ඇවිදින් හිඳි
දොර ලඟ හින්ද නෑ
නෙත ලඟට එන්නේ
හදවතේ සුසුමක් නැගෙන්නේ
පැයෙන් පැය දින ගෙවිල
යන්නේ ආයෙ කවදද ගෙදර
එන්නේ

සංසෙ පින්නවල *PHIM*
සංඥ මූලික වැඩපල

## වේදනාව

වෙනදාවගේ හැන්දෑවක මා එනතුරු
පාරදිහා තාමත් මගබලාගෙන ඉන්නවාද
කියන්න මේ කඳු මේ මංමාවත් මේ මන්දිර
මේ ගහකොලත් අතරින් හෝ
සෙනඟ පිරුන මහ නගරයකදිද
මහ වැස්සකදිද කුනාටුවකදිද
විශාල කන්දක් උඩදිද
මහා රන්දෝලි පෙරහැරකදිද
පන්සලකදිද කනත්තකදිද කියන්න
කොතැනකද ඔයා මුනගැහෙන්නේ
කෙදිනක හෝ දවසක
ඔයාට එන්න වෙනවා
එන දවස මට පැදගන් නෑ
ඒත් කවදා හෝ දිනක ඔබ
එනබව පමණක් කියන්න
බලා ඉන්නම් මම
වේදනාව ඉවසාගෙන

ස/279484
සංසෙ බන්ඩාර *MMS*
සංඥ මූලික වැඩපල

## නිසල රැය

සීතල රැය රෑහැයි හඬින්
මුළු හදවත කිති කැවිනා
නිකිණි මහේ සඳවතිගෙන්
නුඹේ සෙනෙහස මට ලැබුණා...
ජීවිතයේ පැතුම් ගොඩක්
හද ඇතුලෙම ගොඩ ගැසුනා...

එවන් පැතුම් මල් පිපිලා
යුධ ගිනිදැල් නිවිලා
සැම හදවත් සැනසෙන්නට
සිතා කැළුම් පිපිදෙන්නට,
හෙට පායන හිරු එළියෙන්
මුළු දැයටම සෙත් වේවා...

සැරයන් රාජකරුණා ආර්එච්එම්කේ
8 ශ්‍රීලංසංබ (ආ/බ)

## තල් වැටේ මායිමේ...

සොඳුරු යොවුනය
කාකි ඇඳුමවින්
ගල් තොප්පියවන්
සිර කරන් සිටින
දඟකාර සෙබළුනේ...
නුබලා අද විඳින
දුක් කම් කටොළු
හෙට උපදින
මතු පර පුරේ
සිනා රැල්ලයි...
පුංචි උඩ ඉඳන්
සෑ ගසන මෝඩ
මිනිසුන් නොව
සැබෑ මිනිසුන් වන්නේ
සොල්දාදුවන්
වන නුඹලාය...

සෙ/276987
ලා/කෝ රූපසිංහ ඒවම්





## සැමදා දිනේ 5 සංඥා බලකාය

| | |
|---|---|
| අනූ හතරේ සිට අවුරුදු | දාහතරක් |
| ඇති දැඩි වෙන්න මට විය ඇය මහ | රුකුලක් |
| මා හට ලබා දුනි ඔවදන් | දස දහසක් |
| ඇය හට තුති පුදමි තබමින් | මල් කලඹක් |
| | |
| ඇය ඇකයේ සිටිය අවුරුදු | දාහතර |
| මා ලැබූ අත් දැකීම් ඇත මහ මෙර නිතර | |
| ඒ මුළු කාලයම විසුවත් | නැගෙනහිර |
| වැනසිය නොහැකි විය ඇය | සතුරනට පර |
| | |
| දෙදහස් අටේ මාර්තු මස | විසි වෙනිදා |
| හදවත පැලී යන අණයකි | ලැබුනෙ එදා |
| මා ඇති දැඩි කල මවුතුමියව | හැරදා |
| අකමැත්තෙන් උවද පිටමං උනෙමි | එදා |
| | |
| සොහොයුරු කැල දකින විට වැගිරෙයි | කඳුළු |
| උන් හා දොඩමළු වීමට වත් | බැරිළු |
| දෙඅතින් පිසදමා දෙනෙතින් එන | කඳුළු |
| මවු තුමියගෙන් සමු ගත්තෙමි පිස | කඳුළු |
| | |
| 5 සංඥා බලකා මගෙ | මවු තුමිය |
| මා දැඩි කල ඔබ හට මා | ණය ගැතිය |
| මට වැඩි කලක් ඔබහට ආයුෂ | වැඩිය |
| සැමදා දිනේ 5 සංඥා | බලකාය |

සෙ/275820
සැරයන් කරුණාරත්න පීඩබ් 8 රෙජි ශ්‍රීලංසංබ
සී බළඝණය, පෙරිය මඩු කුලම් - වවුනියාව



## සෙවළු සිතක්

ඔබයි දේශයේ විරුවන්......?
ඔබේ සමණල යොවනය
උපන් බිමටම උරුමකරදී
මාපිය නෑසිය මිතුරන් අතහැර
රුදුරු ගිනි අවිය ලයමැදට තද කර
තල් වැටේ මායිමේ...
සුසුම් හෙලනා සෙබලුනේ
නොසිතන්න කිසිවටක
ඔබ තිනිව් ඇත කියා
හෙට දිනේ ඔබ මෙන්ම
යුධ වදින්නට මා
ඔබට සවියක් වෙමි.

සෙ/275881
කෝප්‍රල් අචිර ඉරෝෂන් කස්තුරිආරච්චි
8 ශ්‍රීලංසංබ
කල්මඩු - වව්නියාව

## 6 වන සංඥා බලකායට උපහාර වේවා

| | |
|---|---|
| වෙඩි හඬ ඇහෙනවා මහ සද්දෙන් | උතුරේ |
| එනමුදු බිය නොවුනි අප කිසිවට | මිතුරේ |
| දහසක් කම් කටොළු විඳිමින් | වැලි කතරේ |
| හය සංඥා බලකායේ | ඔද පැතිරේ |
| | |
| වනසා දමා සැම මොහොතෙම පර | සතුරන් |
| බාධක කම් කටොළු සැමදේ | ඉවසා දරන් |
| සේවය කළෙමි පස් වසරක් | හරි සතුටින් |
| හය සංඥා බලකායේ නම | රකිමින් |
| | |
| හය සංඥා බලකා මගෙ | මෑණියනි |
| මා ඔබ සිහි කරන්නේ හදපිරි | තුටිනි |
| මේ ලෙස පතන්නේ ඔබ හට මෙත් | සිතිනි |
| සැමදා ඔබට ජය වේවා | මෑණියනි |

සෙ/279855
ලා/කෝ ප්‍රසාද් ඩබ්ඒ 8 රෙජි ශ්‍රීලංසංබ
සී බලඝනය, පෙරියමඩු කුලම්
වවුනියාව

## සිහිවූ මොහොතක

| | |
|---|---|
| වැසිදිය ගලයි තෙමිලා ගත වන | අහසේ |
| සිහින ලොවේ ඈත ඔබලා සුව | යහනේ |
| අපි දිවි පැවත නැහැ ඔය කාටත් | පෙනුනේ |
| මේ බිම ජය ලබන්නයි පෙරටම | ඇදුනේ |
| | |
| ආලය විනා එක්වමකි | දෙදෙනෙකුගේ |
| පිදු ආදරේ කොතැනද අඩුවක් | දැවුණින් |
| තනිවන සිතක ඇති දුක නැතිවද | නැගුනේ |
| සෙනෙහස ලඳුනි මෙලෙස ඇයි නපුරු | වුනේ |

සෙ/280392
සංසෙ රටගේ ටීඩී 8 ශ්‍රීලංසංබ, යු. හ. කඳවුර
කල්මඩු - වව්නියාව

## මගෙ ආදර අම්මා



"රන් මිනි මුතු දුන්නත් අපට ඉස්තරම්
ඔබෙ සෙනෙහස තරම් වටිද රත්තරං
ගුණ ගයන්න ඔබේ නමින් නොමැත මට වරම්
සසර පුරා නුඹයි අම්මේ මගේ රත්තරං..."

සෙ/183786
ආසෙ අමිත් එස්ඩබ්
8 ශ්‍රීලංසංබ (ආ/බ)

# අට සංඥා බලකායට දීඝායුෂ

දෙදහස් අටේ මාර්තු මස විසිහය දින උපත ලබා
රට රැකුමට සුභ මොහොතින් ආවා විය පෙරට තබා
බලඇණි පුහුණුවෙන් පසුව සටනට ගත උනිය "සභා"
අට සංඥා මවුතුම්යට වඳිනෙම් මම දෙදන තබා

මගේ පැතුම හද සතුටින් පුදනෙම් මා මේ විලසින්
උපත ලැබූ මොහොතේ සිට නැගිටින්නට තම විරියෙන්
පෙරටම යමු පර සතුරන් නැසුමට සැම එකම සිතින්
එන සියළුම බාධකයන් ජයගමු සැම එකමුතුවෙන්

අට සංඥා බලකායට පතනෙම් මම දීඝායුෂ
අපල විපත් නොමවේවා කියා පතම් මේ විලස
මගෙ මවුතුම් යන මාවත සරසන්නේ මා කෙලෙස
ඔබ තුම් යන මාවත්වල අතුරන්නෙම් රතු පළස

සෙ/275820
සැරයන් කරුණාරත්න පීඩබ්
8 රෙජි ශ්‍රීලංසංබ සී බළඝණය
පෙරිය මඩු කුලම් - වවුනියාව

# කිසිදු දිනයක නොයම් හැරදා

කිසිදු දවසක
නොසිතූ විලසින්
හමු උනා ඔබ මට...හමු උනා...

දසත කලුවර ගලාගෙන එයි
සඳේ සිසිලස මුවාවී යයි...

පැතුම් පොදි බැඳ උන්න මා හට
යන්න කියනවා නුඹ ළඟින් හිමිහිට...

අඳුරු වූ මගේ දිවියට
කපා පෑයූ විසල් සඳ නුඹ
තනි කර දමා නොයම් මා
නුඹේ දෙනෙතට කඳුළු එක්කර...

සෙ/277551
ලා/කෝ සේනාධීර ජේඑම්එන්
8 ශ්‍රීලංසංබ (ආ/බ) යු. හ. කඳවුර
කල්මඩු - වව්නියාව

# අහිමි නුඹ

සඳක් නෑ අද නුඹත් නෑ ලඟ
හිතක් පාලුයි අහස සෙ
නිදං වැටි වැටි දෑස නෑ නිදි
නුඹ ලඟ මගේ ආදරේ

කෙනෙක් කීවත් නෑ කිව්වේ නෑ නුඹ
වැරදි නැති මට මා අතේ
උදුර ගන්නට නුඹ නුඹේ සිත
ඔයා ලඟ මගේ ආදරේ

නුඹේ නුවන් අග කඳුලු නොකියා
නුඹට දුන් මගේ ආදරේ
හැඳින ගත්තේ නැති නමුත් නුඹ
ඔබ ළඟ මගේ ආදරේ

සෙ/184356
සංසෙ ප්‍රදීප් ඩබ්අයි
ආධාරක කණ්ඩායම
8 ශ්‍රීලංසංබ - යු. හ. කඳවුර
කල්මඩු - වව්නියාව

# සංඥා පවුලේ හැදුන මම

සංඥා මෑණියන්ගේ හතරවන දුවගේ
උණුසුමේ හැදුන වැඩුන මම අයත්ත
කියන්න ඉගෙන ගත්තේ ඇයගෙනි...
එහෙත් අවුරුද්දක් පමණ කෙටි
කාලයකින් ඇයගෙන් වෙන් වී
5 වන සංඥා දුව ලඟට යන්නට
සිදු උනි...
මා ටිකෙන් ටික හැදී වැඩී පරිනත
මිනිසෙකු උයේ ඈ ලඟ උන්
නිසාය...
ඇගෙන් උගත දෑ බොහෝය පසුව පස්වන
සංඥා දුව මගේ මව් විය...
මව් කෙනෙකුගෙන් ලද බොහෝ දෑ
මට ඇගෙන් ලැබිණි...
අවාසනාවකට ඈ දමා මගේ කිරි අම්මාගේ
බාලම දියණිය වන 8 සංඥා දුව ලඟට
එන්නට සිදු විය...
දැනට මා ඇගේ සෙවනේ පසුවන්නේ
ඉමහත් සතුටිනි...

සෙ/276987
ලා/කෝ රූපසිංහ ඒවම්
8 ශ්‍රීලංසංබ (ආ/බ)





# ආයාචනා...

ලිපියක් වත් ඇයි එවන්නෙ
නැත්තෙ සුදූ
ආයෙත් ඔබ මා අමතක
කරාද මංදා
ගිහි අවියක් අතින් අරන්
සටනටත් ගියා
සිතුවද මෙමා ඒ සටනින්
මිය ගියයි කියා

ඒ සටනින් බට්ටෙක් මට
පෑගුණු හින්දා
අතයි කකුලකුයි මා හට
අහිමි වී ගියා

මගෙ අත පය නැතිවිට
ඔබ ඒ බව දැකලා
මගෙ මිතුරට පෙම්
කෙරුවනේ මා එපා කියා

පෑරූ සිතක් පාරන්නට
සිතන්නට එපා
බිඳුණු සිතක් හට ඔබ
දුක් දෙන්නට එපා

සෙනෙහෙ පිපුණු මල දැක
පොඩි කරණු නම් එපා
මෙවන් දුකක් මගෙ
මිතුරට දෙන්න නම් එපා

සෙ/280210
සංසෙ පුෂ්ප කුමාර ඒජීඑන්
8 ශ්‍රීලංසංබ - ඩී බලඝනය
කල්මඩු - වව්නියාව

# මතකය අවදිවූයේ ඇයිද කියන් සබඳ

එදා මා සිතූ පරිදි ඔබද මට හමුවම
ඔබද ඒ බව මට පසන් කල හමුවම
අපද සිහිනෙකින් වත් ඒ හමුවම
ඔබද මා මෙන් සිතුවිය ඒ හමුවම

අවධි වූ ඒ අතීතය
අලුත් බවක් එහි ඇතිවිය
පැරණිකම අලුත් වූ විට
තවත් අලුත්වේද ඒ අතීතය

සෙ/66849
ලා/කෝ සෝමරත්න එච්පී
8 වන රෙජිමේන්තුව සංඥා බලකාය (ආ/බ)
යුධ හමුදා කඳවුර - පරසන්කුලම්
වවුනියාව



# සිතක හැඟීම්

රැකියාව - යුද්ධය
බලාපොරොත්තුව - උණ්ඩය
ප්‍රථිඵලය - මරණය
ලැබීම - දෙමාපියන්ට
උරුමය - මහපොලවට
මතකය පමණක් - පෙම්වතියට

සෙ/2C00576
ලා/කෝ ගුණරත්න ඩීඑම්
8 ශ්‍රීලංසංබ (ආ/බ)
පරසන්කුලම් - වවුනියාව

# සෙබළ පුතුගෙන් මවට ආයාචනා

මගේ සුදු පුතේ කියමින් මා ගෙන ලඟට
සිඹිමින් මුහුණ මා ලමැදට තුරුලු කොට
බත් පත අනා කැවූ ඔබේ පොඩි පුතා හට
සටනට එන්න ලැබුනේ වාසනාවට

අම්මේ ඔබේ කිරිවල බල තිබෙන තුරු
සව්බල තිබෙයි අවියට අත කරන හුරු
අප ලඟ කැරකුනත් නිතරම රුදුරු මරු
අපෙ දිවි තිබෙන තුරු රට බෙදුම බොරු

ඉන්නා පුතුන් හට හෙට දින උපදින්න
නිදහස් රටක් ඕනෑ ජීවත් වෙන්න
සටනෙදි මා මලොත් අම්මේ නොහඩන්න
ජාතිය නමින් හිත සනසාගෙන ඉන්න

සෙ/278464
කෝප්‍රල් බංඩාර ආර්බීයූපී
8 රෙජි ශ්‍රීලංසංබ (ආ/බ)
යු. හ. කඳවුර - පරසන්කුලම්
වවුනියාව

# සෙබල පුතුගේ මව් සෙනෙහස

බිහිවුණු මෙලොවට විරෝධාර පුතෙකු
ලෙස මව් කුසින්
ඇති දැඩි කල මව් වියන් දුක් වේදනා විඳිමින්
තරුණ වියට පා තබන තුරු අකුරු
කලත් ගමේ පාසලෙන්
පින් මදි වුවා යන්නට සරසවිය වෙත
නැගුණා රුදුරු යුද්ධයක් ජාතියක් වසන්නට
බැඳුණා ලක් මව රකින්නට අද මා
යුද සෙබලෙක් ජාතිය සුරකින

සෙ/275754
සංසෙ උදය කුමාර ආර්ඒ
8 ශ්‍රීලංසංබ (ආ/බ)
යුධ හමුදා කඳවුර
පරසන්කුලම් - වවුනියාව

# සිතුවිලි

තංගියෙ එපා සෙබලුන් හට දුක් දෙන්න
හැකිනම් දෙන්න සුදු මල් පොකුරක් මෙමට
දෙවියන් වැනි නුඹලා සැම දෙන අපට
සත්තයි එනව නුඹ පාමුල පිපෙන්නට

පළඳින යුධ ඇඳුම සිසිලක් ගෙන දේවා
අත රැඳි අවිය නිසි එල්ලෙට යොමු වේවා
සතුරන් නුඹෙ පය දූවිල්ලක් වේවා
තිස් තුන් කෝටියක් දෙවිඳුන් රැක දේවා

සැන්දෑ සමේ හිරු බැසයන වෙලාවක
නිකටේ අත තියන් බර කල්පනාවක
සැනසුම් සුවය සෙව්දැයි මා සැඳෑවක
මා අද කල් ගෙවයි උතුරේ බංකරෙක

සෙ/281878
සංසෙ සෙනෙවිරත්න ඩබ්එම්
යුධ හමුදා කඳවුර
පරසන්කුලම් - වවුනියාව

## පතිනි දෙවිඳුන් නමට කැප කළ පින් පඬුර අම්මා

කඳුළු පත්හිඳ අකුරු කරවූ ධම්ම පදයයි අම්මා
අඳුරු ලෝ තල එකළු කරනා පහන් රුව අම්මා
තිලොව සනහා සිත පහන් කළ තුන් පිරිත අම්මා
රුවන්වැලි මහ සෑයෙ දිලෙනා මුදුන් කොත අම්මා

විසල් දළදා මැඳුරෙ රැව් දෙන තේමා හඬ අම්මා
සමන් ගිරි හිස බැතින් පුදදෙන සුදු නෙළුම අම්මා
කුසක් පිරවූ බතට දිය රැඳි වැව් දිය නිල්ලයි අම්මා
පතිනි දෙවිඳුන් නමට කැප කළ පින් පඬුර අම්මා

සෙ/281831
සංසෙ රත්නායක එච්පීආර්සී
යුධ හමුදා කඳවුර
පරසන්කුලම් - වවුනියාව

## සොඳුර

හිරු බැස ගිය මොහොතක
සඳු නැග එන සැඳෑවක
එන්න මා ළඟට ඔබ ආදරෙන්
සිරි දෙව්දුවක සේ පෙනේවි ඔබ මට

දසත සැරි සැරූ තනිකම
කුරුල් පිහාටුවක් වගේ දෝතට අරන්
කියන්න ඔබේ ආදර ගීතය
සුරදූතියක් සේ පෙනේවි ඔබ මට

මා ඔබේම වී ඔබ මගේම වී
සසර සැරිසරන්න
ප්‍රාර්ථනා කරමු
මා ඔබට ආදරෙයි සත්තකින්ම

සෙ/281781
සංසෙ බීංඩාර එල්ඩබ්ලිව්සීඑ්පී
8 ශ්‍රීලංසංබ - යුධ හමුදා කඳවුර
පරසන්කුලම් - වවුනියාව

## සිහිවූ මොහොතක

වැසිදිය ගලයි තෙමිලා ගත වන අරනේ
සිහින ලොවේ ඇත ඔබලා සුව යහනේ
අප දිවි පැවත නැහැ ඔය කාටත් පෙනුනේ
මේ බිම ජය ලබන්නයි පෙරටම ඇදුනේ

ආලය විනා එක්වීමකි දෙදෙනකුගේ
පිදූ ආදරේ කොතැනද අඩුවක් දැනුනේ
තනිවන සිතක ඇති දුක නැතිවද නැගුණේ
සෙනෙහස ලඳුනි මෙලෙස ඇයි නපුරු වුණේ

සෙ/280392
සංසෙ රටගේ තුෂාන් දිල්රුක්
8 ශ්‍රීලංසංබ
පරසන්කුලම් - වවුනියාව

## ඇහිමි ඇයට

සිතිවිලි ලොවේ නිති ඔබෙ රුව දකින්නෙමි
පැතුමන් මිලින වූ බව දැන නැවෙන්නෙමි
නෙතු පිය අසල කඳුලක් ලෙස රැඳෙන්නෙමි
මතු බවයකදි හෝ යලි ඔබ පතන්නෙමි

සෙ/279646 සංසෙ සිරිසේන එස්පී
3 ශ්‍රීලංසංබ - පලාලි

## හිනැහෙන්න

හිනැහුනා ඔබ - ඔබ පුතු ඉපදුන දවසේ
හිනැහුනා ඔබ - ඔබ පුතු දෙපයින් සිටගත් දවසේ
හිනැහුනා ඔබ - ඔබ පුතු රණවිරුවකු වූ දවසේ
හිනැහෙන්න ඔබ - ඔබ පුතු රට වෙනුවෙන්
දිවි දුන් දවසේ

සෙ/276787
සැරයන් ආරියසිංහ RDC







## හෙළ රජ මුතුහර

නම ඇසූ පමණින්ම සතුරගෙ දත නැමුණු
බුදුදම තුලින් දිවියක් ඇරඹුව දැමුණු
රට ජාතිය සමය දියුණුව වෙත පැමුණු
ලක්මව ගෙල පැළඳි මුතුහර දුටු ගැමුණු

ඔද බිඳ දා රුපුන් සටනට නම් දැරුව
ලක් මව කුසේ උපදින්නට පිං කෙරුව
හෙළු විකුමන් බලෙන් සතුරන් සුන් කෙරුව
විජයබා රජුය ලකඹර රං තරුව

එක වැසි බිඳක් වත් අපතෙට ඇදෙනු නොදි
හෙළදිව දහස් ගණනක් වැව් අමුණු බැඳි
සමුදුර විලි වදින පැරකුම් සයුර සැදි
දෙවිවරු පවා පැරකුම් රජ රුවට වඳි

විහිදා යවා තම විදූ සක්විති මොලය
සක්කරයත් පා හෙළු ලේ වල බලය
ජයගත් එදා බුදු සමිඳා අර ගලය
මහසෙන් නමඹ බලවයි ලක් මිහි තලය

පෙන්වා සොලි මහ රජුටත් සිහල බලේ
ගෙන ආ තම පිරිස සමගින් උනගෙ කුලේ
පුන් සඳ කිරණ ලෙය සිරිලක් ගගන තලේ
ගජබා රජුගෙ නාමය සදහටම දිලේ

පිළිගෙන හද බැතින් බුදු අම දම් වැස්ස
සුමගට යවා තම රටවැසියන් සෙස්ස
පිරිපුන් එබාදු රජෙකු වී සුමගට බැස්ස
ලා හිරු කිරණ මෙනි රජ දෙවි පිය තිස්ස

මේ රජ සුවන්ගේ ඔද හදවතෙහි තම
සනහා තොද විකුම් පෙන්වා අනගි තම
ජනමෙන් සදා රැකගනිමින් සමගි කම
තොඩිවමු ලක්වමිය රැකගෙන සිහල කම

සංඝා පුහුණු පාසලේ සරබ උපදේශක,
බනි 11 ආරියවංශ කේඩබ්ඩ් ගේ පියා
ජස්වින් ආරියවංශගේ නිර්මාණයක්

## බිරිඳකට තුති

ජීවන සයුරෙ පැදයනු බැරිකල හැරුව
ඒ මේ අත පාවෙමින් නැති කිසි සරුව
යලි නිසි මාවතට ගෙනදි පන පිරුව
ඔබ රැපිනක්ය මගෙ දිවි මග සරු කෙරුව

භවයෙන් භවයෙ පැතූ ලෙස නොබිඳෙන බැම්ම
මෙලෙසින් හමුවුනා සිත්තුල ඇති නැම්ම
තනු ගුණ කීම ඔබ ගැන නැත කිසි නිම්ම
තනානම් බැම් පවුරු සිඳ බිඳලා දැම්ම

දහසක් පැතුම් පොදි බැඳගෙන හද ඇටින
මා වෙත පුදකලා ලෙන්ගතු කම වටින
ඉන් නව පන්නරය මා ජීවිත ලැබුන
ඔබ නැති ලොවක නොවටී මිණිරන් කුමන

සිත් සන්තාප කිසි දිනයක අපට නැති
මේ බැඳි යදම් දිවි මාවත තදට එති
පිපි හද කුසුම දූන්නට පුද කරමි තුති
එනිසා ඔබ මගේ - මා ඔබේ වෙන්න ඇති

පබඳින විටදි ඇතිවේ නව කවි සිතිය
ලැබදුන් ජය නිසා මට බෝ දේ හැකිය
දූන් ලෙන්ගතු කමට සිත තුල ඇත බැතිය
කවිසර ලියා සමුගන්නම් හිතවතිය

සෙ/66862 බනි 11 ආරියවංශ කේඩබ්ඩ්
සංඥා පුහුණු පාසල
බුවැලිකඩ

## බංකරයේ තනිකම

සැමදා තල් බංකරයේ සැඟවිලා
අවියක් මගේ තුරුලට හිරවිලා
ආදරයෙන් අප සැම වෙන්විලා
තුරුණු විය යයි බංකරයට යයි ගෙවිලා

සෙ/278824 ලා/කෝ සරත් කුමාර ආර්එම්
6 ශ්‍රීලංසංබ(ආ/බ) - බී කණ්ඩායම

## කෙදිනකද නිවාඩුව

මල් පෙති වල සුවඳ රැගෙන
පාට පාට හැම ගිනෙම
නුඹ එනවා හැම දාකම
තනිවුන මගෙ සිත ගාවට

අවියක් ගෙන මගේ අතට
රාජකාරි හැම මොහොතෙම
සදහෙනෙ රැඳෙන කඳුළු බින්දු
නුඹ නෙතුවෙත් තමයි මැනික

නිවාඩුවක් ලද විගසම
මා එනවා ඔබ සොයාන
රිදුම් දෙන හදත් රැගෙන
මා එනතුරු ඉන්න මැණික

සංසෙ රත්දෙනි RPAK
සංඥ මූලික වැඩපල

# මන්දාකිණිය

## රට ගැන යමක්

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ විශාලත්වය | - | ව:කි:මි 65610 |
| ශ්‍රී ලංකාවේ දිග | - | කි:මි 432 |
| ශ්‍රී ලංකාවේ පළල | - | කි:මි 224 |
| ශ්‍රී ලංකාව අයත් වන්නේ | - | ආසියා මහද්වීපයට |
| ශ්‍රී ලංකාවේ විශාලතම දූපත | - | තලෙයි මන්නාරම |
| ශ්‍රී ලංකාවේ ඇති ගංගා ගණන | - | 103 |
| ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය | - | නා ගස |
| ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා | - | වලි කුකුළා |
| ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව | - | වොලිබෝල් |
| ශ්‍රී ලංකාවේ උසම දියඇල්ල | - | බඹරකන්ද |
| ශ්‍රී ලංකාවේ දිගම පාලම | - | මනම්පිටිය පාලම |
| ශ්‍රී ලංකාවේ දිගම ගඟ | - | මහවැලි ගඟ |
| ශ්‍රී ලංකාවේ විශාලම වැව | - | සේනානායක සමුද්‍රය |
| ශ්‍රී ලංකාවේ විශාලම වනාන්තරය | - | සිංහරාජ වනාන්තරය |
| ශ්‍රී ලංකාවේ විශාලම ජලාශය | - | රංදෙනිගල ජලාශය |
| ශ්‍රී ලංකාවේ විශාලම මල්වත්ත | - | පේරාදෙනිය මල්වත්ත |
| ශ්‍රී ලංකාවේ උසම දුම්රියපොල | - | පට්ටිපොල දුම්රිය ස්ථානය |
| ශ්‍රී ලංකාවේ විශාලම ඉන්ධන විදුලි බලාගාරය | - | කැළනිතිස්ස |
| ශ්‍රී ලංකාවේ විශාලම චෛත්‍යය | - | ජේතවනාරාමය |
| ශ්‍රී ලංකාවේ ප්‍රථම ජලවිදුලි බලාගාරය | - | ලක්ෂපාන ජල විදුලි බලාගාරය |
| ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ දිග | - | කි.මී 1700 යි |
| ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව | - | නාවික සැතපුම් 200 යි |
| ශ්‍රී ලංකාවේ විශාලතම ගල්ලෙන | - | පාහියන්ගල |

- (පොතපත ඇසුරෙනි)

සෙ/277293 කෝප්‍රල් බාලසූරිය බීඑස්කේ
3 ශ්‍රීලංසංබ - පලාලි





# ගෘහස්ථ විදුලි උපකරණ සඳහා සරල අඩු වියදම් පරිපථ ආරක්ෂකයක් (OVER VOLTAGE PROTECTOR)

ශ්‍රී ලංකාවේ සම්මත ප්‍රධාන විදුලිබලය 230V වේ. අප භාවිතා කරනු ලබන උපාංග බොහොමයක් එයට සරිලන ලෙස 220-240 V විදුලි බලයකින් ක්‍රියා කිරීමට හැකි වන පරිදි නිපදවූ ඒවා වේ. එහෙත් ප්‍රධාන විදුලි බලය බාහිර බලපෑම් මත සමහර අවස්ථාවලදී එහි අගය 300V හෝ එයටත් වඩා ඉහල අගයකට පැමිනේ. එවැනි අවස්ථාවලදී ප්‍රධාන විදුලි බලය හා සම්බන්දව ක්‍රියාත්මක වෙමින් පවතින (විශේෂයෙන් කැසට් යන්ත්‍ර, පරිගණක හා ශිතකරණ වැනි) උපාංග වලට හානි සිදුවීමට ඇති අවදානම වැඩි වේ. නිවසේ ඇති ට්‍රිප් ස්විචය ආධාරයෙන් මෙවැනි අවස්ථාවලදී නිවසේ විදුලි බලය විසන්ධි කර එවැනි අවදානම් අවස්ථා මගහරවා සියළු විදුලි උපාංග ඇතුළු විදුලි පද්ධතිය ආරක්ෂා ගරගත හැකි විදුලි ආරක්ෂක පරිපථයක් පහත දැක්වේ. මෙය 5A හෝ 15A විදුලි ජේනුවකට පහසුවෙන් සවිකරගත හැකි අතර එහි භූගත සම්බන්දය නිසිපරිදි පැවතිය යුතු වේ. පරිපතයේ සියළු සවිකිරීම් නිමකිරීමෙන් පසු අවදානම් විදුලි බලය (300V පමන) ට රිලේ උපකරණය ක්‍රියාත්මක වන තුරු V/R සිරුමාරු කරන්න. අනතුරුව ජේනුවේ හා පරිපතයේ N,L හා E අග්‍ර නිවැරදි ලෙස එකිනෙක සම්බන්ද කල යුතු වේ. මෙම පරිපතය ප්‍රධාන විදුලිබලය මගින් ඉඳුරාම ක්‍රියාත්මක වන බැවින් නිර්මාණය කිරීමේදී එහි අවදානම ගැන සැලකිලිමත් විය යුතු අතර ප්ලාස්ටික් හෝ ලී පෙට්ටියක් තුල ආරක්ෂිත ලෙස බහා භාවිතා කල යුතු වේ.




සෙ/66791 බනිII: ජයසේකර JTRP සංඥවැ

# මංගල සිනු




2008.06.23 දින
සුභ මොහොතින් අතිනත ගත්
ලුතිතන් එන්පී කස්තුරිආරච්චි සහ
දිනුශක්මි මලවනවිතානගේ
සිය පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ



2008.04.30 දින
සුභ මොහොතින් අතිනත ගත්
මේජර් එම්ඒඩීඑස් මුතුගල සහ
එච්පී ඉරෝෂනි ප්‍රසංගිකාගේ
සිය පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ



2007 මැයි මස 04 දින සුභ මොහොතින්
අතිනත ගත්
3 වන සංඥා බළකායේ කපිතන්
ඩීඑම්එම්බී ජේරත් සහ 1 වන කාන්තා බළකායේ
ලුතිතන් පීඑස් රන්කොත්ගේ
සිය පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ




2007.07.02 දින
සුභ මොහොතින් අතිනත ගත්
මේජර් එච්ඒඩීඩබ් හෙට්ටිආරච්චි සහ
නිලුකා හෙට්ටිආරච්චිගේ
සිය පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ



2008 ඔක්තෝබර් 10 දින සුභ මොහොතින්
අතිනත ගත්
මේජර් බුද්ධික උඩගේ සහ දිල්ෂාරා
සිය පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ








කපිතන් ආර්එම්කේයුකේ රත්නායක
හා ගීතිකාගේ
පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ



2007.05.23 දින
සුභ මොහොතින් අතිනත ගත්
කෝප්‍රල් වසන්ත කුමාර එන්ඩීජී
සහ පීආර්එච්එස් දමයන්තිගේ
සිය පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ




2008.08.13 දින
සුභ මොහොතින් අතිනත ගත්
කපිතන් ඩීඒඑන්එල් තෙන්නකෝන්
සහ රුක්ෂිකා සංජීවනිගේ
සිය පැතුම් ඉටු වූ
වාසනාවන්ත දිනයේ



සුභ මොහොතින් අතිනත ගත්
සෙ/2සී00664 ලාකෝ අබේකෝන් ඒඑම්ඩීබී සහ
උදේනි චම්පිකාගේ
සිය පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ



2008.09.04 දින
සුභ මොහොතින් අතිනත ගත්
කපිතන් ඒඑම්ඕකේ අතපත්තු සහ
එන්එන්ඒ කොඩිප්පිලිගේ
සිය පැතුම් ඉටු වූ වාසනාවන්ත දිනයේ


SIGNALLER


Riggers In Action
"Sky is the limit"